# වාර්ෂික වාර්තාව

# 2019

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2020-08-21

ගරු බන්දුල ගුණවර්ධන
වෙළඳ අමාත්‍යාංශය
අංක 27,
සතොස මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 2

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2019**

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2019 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිතුමාගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට- විශ්වාසී



ප්‍රභාෂ් සුභසිංහ

සභාපති

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1. | අපනයන සංවර්ධන මණ්ඩලයේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ | 4 |
| 2. | සභාපතිතුමා ගේ පණිවුඩය | 5 |
| 3. | ආයතනික තොරතුරු - අධ්‍යක්ෂ මණ්ඩලය | 6-7 |
| | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය | 8 |
| 4. | අපනයන කාර්යසාධනය 2019 | 9 |
| | ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය 2019 | 10 |
| | අපනයන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අංශ | 11-14 |
| | ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම | 15-22 |
| | ජාතික අපනයන උපායමාර්ග | 23 |
| | අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පහසුකම් සැලසීම | 24-39 |
| | 2020 වසර සඳහා අනාගත සැලසුම් | 40 |
| 5. | මූල්‍ය ප්‍රකාශන 2019 | 43 |
| | 2019.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 44 |
| | 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය | 45 |
| | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 46 |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 47 |
| | මූල්‍ය ප්‍රකාශන සටහන් | 48 |
| 6. | විගණකාධිපතිගේ වාර්තාව | 58 |

## අපනයන සංවර්ධන මණ්ඩලයේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ

අපනයන ඉපැයීම් වැඩිකරමින් රටේ ආර්ථික වර්ධනය උදෙසා දායකත්වය ලබාදීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) පුමුඛතම කාර්යභාරය වේ.

### 1979 අපනයන සංවර්ධන මණ්ඩල පනත

අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ 1979 දී ස්ථාපනය කරන ලද අපනයන සංවර්ධන මණ්ඩලය  ජාතික අපනයන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීමෙහිලා එහි වගකීම් ඉටු කරමින් ප්‍රතිපත්ති උපදේශකයෙකු, අධීක්ෂකයෙකු, ප්‍රවර්ධකයෙකු, පහසුකම් සලසන්නෙකු හා දැනුම ලබාදෙන්නෙකු ලෙස කටයුතු කරනු ලැබේ.

VISION

නව නිපැයුම් සහ සේවා සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම.

MISSION

නවෝත්පාදන, ව්‍යවසායකත්වය හා ගෝලීය ඒකාග්‍රතාව තුළින් අපනයන තරගකාරිත්වය තහවුරු කිරීම.

### අරමුණු

- 2022 වන විට වෙළඳ භාණ්ඩ හා සේවාවන් මගින් ලබන විදේශ විනිමය ඉපයීම් ඇ.ඩො.බිලි.28 දක්වා වැඩිකිරීම.
- 2022 වනවිට අපනයනයන් හා දළ ජාතික නිෂ්පාදනය අතර අනුපාතය 25% දක්වා වැඩිකිරීම.
- ජාතික අපනයන උපායමාර්ගන්හි ඉලක්කගත අංශවල අපනයන් 10-20% අතර ප්‍රමාණයකින් ඉහල නැංවීම.
- අපනයනයන්හි නිරතව නැති දේශීය ව්‍යවසායකයින් 2,000ක් අපනයනකරුවන් බවට පරිවර්තනය කිරීම.
- නව නිෂ්පාදන/සේවා 4 ක් හෝ 5ක් [ඉලෙක්ට්‍රොනික, පරිවෘත විද්‍යුත් වයර්, වාහන උපාංග හා ආහාර පිරිසැකසුම් කර්මාන්ත, අන්තර්ජාලය හා සම්බන්ධ කරුණු (IOT), ආදිය.] අපනයනයන් අතරට එක් කිරීම.

## සභාපතිතුමා ගේ පණිවුඩය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) 2019 වසරේ දී සිය 40 වන සංවත්සරය සමරනු ලැබීය. එය හුදෙක් සන්ධිස්ථානයක් හෝ සංඛ්‍යාවක් නොවේ; එයින් හැඟවෙන්නේ පසුගිය දශක හතර තුළ ශ්‍රී ලංකාව ගෝලීය සිතියමේ ස්ථාන ගත කිරීමට සහාය වීමේ කාර්යභාරය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් අත් කර ගත් සවිමත් ප්‍රගතියයි.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනු ව්‍යවස්ථාපිත බලය ලත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය වෙළඳ ප්‍රවර්ධන ආයතනයයි. ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ සියලු කරුණු සඳහා සම්බන්ධීකරණ ආයතනයක් ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ක්‍රියා කරයි. ආරම්භයේ සිටම අපනයන සංවර්ධන මණ්ඩලය, එහි දැක්ම වන අපනයන වර්ධනය, අපනයන සංයුතිය සහ අපනයන වෙළඳපළ විවිධාංගීකරණය කිරීම, නවෝත්පාදන හඳුන්වා දීම මෙන්ම තිරසාර ආර්ථික වර්ධනයක් සහතික කරන රැකියා අවස්ථා උත්පාදනය කිරීම යන කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ණ වශයෙන් කැප වී සිටී. අපනයන ප්‍රවර්ධනයට සහ අපනයන ව්‍යාපාරයන් හි ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම තුලින් අපනයන ප්‍රජාවට පහසුකම් සැලසීමට අපි නිරන්තර උත්සාහයක යෙදෙන්නෙමු.

ශ්‍රී ලංකා රජයේ ඉලක්කය වන්නේ හුදෙක් සාම්ප්‍රදායික අපනයනය මත පමණක් විශ්වාසය නොතබා, අගය එකතු කිරීමේ කර්මාන්ත වැඩිදියුණු කිරීම මගින් අපනයන ආර්ථිකය පුළුල් කර ශ්‍රී ලංකාව සමෘද්ධිමත් දේශයක් බවට පත් කිරීමයි.

ශ්‍රී ලංකාවේ වර්ධනය වන අපනයන හැකියාව සැලකිල්ලට ගනිමින් අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය, ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සඳහා උත්ප්‍රේරකයෙකු සහ ප්‍රවර්ධකයෙකු ලෙස බහු විද කාර්ය භාරයක් ඉටු කරයි. අපගේ ප්‍රධාන උපාය මාර්ගික ආධාරක වන්නේ; පවත්නා අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ඉහළ නැංවීමට සහාය වීම, වර්තමාන ශ්‍රී ලංකා අපනයන සංයුතිය පරිණාමනය කිරීම සඳහා නව අපනයනයන් ප්‍රවර්ධනය කිරීම, නව වෙළඳපළ ප්‍රවේශය, ධාරිතා වර්ධනය කිරීම සහ අපනයන ප්‍රමුඛ විදේශ ආයෝජන රට තුළ උත්පාදනය කිරීමයි.

ඉලක්කගත විදේශ විනිමය ඉපැයීම් ශ්‍රී ලංකාව කරා ළඟා කර ගැනීම වේගවත් කිරීමට අප ගන්නා උත්සාහයෙහි ප්‍රගතිය මෙම නව ක්‍රියාමාර්ග මගින් පෙන්නුම් කෙරේ.

අප ලබා ගත් ප්‍රගතිය සඳහා අගනා දායකත්වයක් ලබා දුන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට සහ සියලු පාර්ශවකරුවන්ට, මාගේ ස්තූතිය ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. එමෙන්ම ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මණ්ඩලයෙහි කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය දැක්වූ දැඩි කැපවීමද මෙහි ලා අගය කරමි.

අපනයන අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ වඩාත්ම වැදගත් අංශය බවට පත් අද දින සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගන්නා අතරම එය ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ නව තලයකට ඔසවා තබන තවත් වසරක් සඳහා අපේක්ෂා තබමු.

**ප්‍රභාෂ් සුබසිංහ**

**සභාපති**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

## ආයතනික තොරතුරු

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2019

| | | | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | ඉන්දිරා මල්වත්ත මිය | සභාපතිනිය හා ප්‍රධාන විධායක නිලධාරිනි | | 2019-11-18 |
| 2. | ප්‍රභාෂ් සුභසිංහ මයා | සභාපති | 2019-12-18 | |
| 3. | ප්‍රභාෂ් සුභසිංහ මයා | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 4. | ජීවන් ඥානම් මයා | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 5. | ශ්‍යාමලී වික්‍රමසිංහ මිය | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 6. | ආචාර්ය යුසුප් මරික්කාර් | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 7. | අනුෂ්කා විජේසිංහ මිය<br>සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය. | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 8. | තුෂාර හේරත් මයා<br>නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය,<br>සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය. | සාමාජික | 2019-01-24 | 2019 නොවැ. |
| 9. | ආචාර්ය හර්ෂ සුභසිංහ<br>(ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)<br>සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි | සාමාජික | 2019-10-14 | 2019 නොවැ. |
| 10. | ඩී.වී.බන්දුලසේන මයා<br>ලේකම්<br>කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය. | සාමාජික | 2019-02-28 | 2019 නොවැ. |
| 11 | කේ.එන්. කුමාරි සෝමරත්න මිය<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>වරාය හා නාවික කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය. | සාමාජික | 2019-02-11 | 2019 නොවැ. |

| | | | සිට | දක්වා |
|---|---|---|---|---|
| 12. | ඩබ්.ජේ.ඩී.එස්.ගුණසිංහ මයා<br>අතිරේක ලේකම් - සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය. | සාමාජික | | 2019 නොවැ. |
| 13. | ඩබ්.එම්.ටී.ඩී.වික්‍රමසිංහ මිය<br>අතිරේක ලේකම් (සංවර්ධන) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය. | සාමාජික | 2019-02-28 | 2019 නොවැ. |
| 14. | එන්.ජී.පණ්ඩිතරත්න මයා<br>අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති)<br>කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ හා සමූපකාර සංවර්ධනය අමාත්‍යාංශය. | සාමාජික | 2019-02-18 | 2019 නොවැ. |
| 15. | සරෝජා සිරිසේන මිය<br>අධ්‍යක්ෂ ජනරාල් (ආර්ථික කටයුතු)<br>විදේශ කටයුතු අමාත්‍යාංශය | සාමාජික | 2019-01-30 | |
| | පී.මොහිදීන් අම්සා මයා<br>අතිරේක ලේකම් (ආර්ථික කටයුතු)<br>විදේශ කටයුතු අමාත්‍යාංශය. | | | 2019 නොවැ. |
| 16. | පී.එච්.ජේ.එස්.විජේරත්න මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව,<br>මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය. | සාමාජික | 2019-02-28 | 2019 නොවැ. |
| 17. | පී.සෙන්තිල්නන්දනන් මයා<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචිකිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු කුසලතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය. | සාමාජික | 2019-04-04 | 2019 නොවැ. |


## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෝෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 1 | සභාපතිනිය හා ප්‍රධාන විධායක නිලධාරිනි | ඉන්දිරා මල්වත්ත මිය [2019.11.18. දින දක්වා] |
| | සභාපති | ප්‍රභාෂ් සුබසිංහ මයා [2019.12.18 දින සිට] |
| 2 | අධ්‍යක්ෂ ජනරාල් | ජීවනී සිරිවර්ධන මිය |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන | ධම්මික ජයවර්ධන මයා [2019.03.06 දින දක්වා] |
| | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන (වැ.බ) | චිත්‍රාංජලී දිසානායක මිය |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මූල්‍ය හා පරිපාලන (වැ.බ) | එම්.කේ.එස්.කේ.මල්දෙණිය මයා |
| 5 | අධ්‍යක්ෂ – කාර්මික නිෂ්පාදන | චිත්‍රාංජලී දිසානායක මිය |
| 6 | අධ්‍යක්ෂ – අපනයන සේවා | එම්.කේ.එස්.කේ.මල්දෙණිය මයා |
| 7 | අධ්‍යක්ෂ – වෙළඳපල සංවර්ධන | අනෝමා ප්‍රේමතිලක මිය |
| 8 | අධ්‍යක්ෂ – කලාපීය සංවර්ධන | අනෝමා කරලියද්ද මිය [2019.10.31 දක්වා] |
| | අධ්‍යක්ෂ – කලාපීය සංවර්ධන (වැ.බ) | ඩී.එම්.පී.දිසානායක මයා |
| 9 | අධ්‍යක්ෂ – අපනයන කෘෂිකර්ම | මාලනී බැද්දේගමගේ මිය |
| 10 | අධ්‍යක්ෂ – මූල්‍ය | ජී.එම්. හේරත් මිය |
| 11 | අධ්‍යක්ෂ – මානව සම්පත් කළමනාකරණ | කේ.කේ.රුවන් කන්නන්ගර මයා |
| 12 | අධ්‍යක්ෂ – ප්‍රතිපත්ති හා උපායමාර්ග සැලසුම් | දයානි වේගපිටිය මෙය [2019.05.15 දක්වා] |
| 13 | අධ්‍යක්ෂ – තොරතුරු තාක්ෂණ | ඉන්දු අලහප්පෙරුම මිය |
| 14 | අධ්‍යක්ෂ – වෙළඳ පහසුකම් සැපයීම හා වෙළඳ තොරතුරු | එස්.ආර්.පී.ඉන්ද්‍රකීර්ති මයා |
| 15 | අභ්‍යන්තර විගණක | නිල්මිණී රණසිංහ මිය |
| 16 | නීති නිලධාරි | ඩී.ටී. විජේරත්න මිය |
| 17 | විගණකවරු | විගණකාධිපති |
| 18 | බැංකුකරුවන් | ලංකා බැංකුව<br>සම්පත් බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව |

<u>**ලියාපදිංචි කාර්යාලය**</u>
නො. 42, නවම් මාවත
කොළඹ 02


# අපනයන කාර්යසාධනය 2019

## ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනය 2019




**වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා වන ප්‍රධාන අපනයන ගමනාන්තයන්**

ප්‍රධාන අපනයන ගමනාන්ත වන ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය හා ඉතාලිය ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 50%කට වැඩි ප්‍රමාණයක් සඳහා දායකවේ.



**අපනයන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ අංශ.**

- භාණ්ඩ අපනයන අංශයේ සමස්ත අපනයනය ඇ.ඩො.බිලි.11.9 දක්වා 0.42% කින් වර්ධනය විය.
- 2019 දී තොරතුරු තාක්ෂණ සේවාවන්, ඇ.ඩො.බිලි.1.1 දක්වා 5.22% කින් වර්ධනය විය.


<u>වෙළඳ භාණ්ඩ අපනයනයේ ප්‍රධාන අංශ</u>

| ඇඟළුම් | තේ | රබර් නිෂ්පාදන | පොල් නිෂ්පාදන | ආහාර හා පානවර්ග |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| 46.8 % | 11.3 % | 7.5 % | 3.8 % | 2.7 % |

<u>සේවා අපනයනයේ ප්‍රධාන අංශ (ඇ.ඩො.මිලියන වලින්)</u>

| අංශය | **2018** | **2019** | වර්ධනය % |
|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණය | 1,035 | 1,089 | **5.22** |
| ඉදිකිරීම් | 65 | 67 | **3.08** |
| මූල්‍ය සේවාවන් | 242 | 213 | **-11.98** |
| ප්‍රවාහන හා සැපයුම් සේවා | 2,486 | 2,339 | **-5.91** |
| ස්වස්ථතා සංචාරක කර්මාන්තය | 193 | 180 | **-6.74** |
| **මුළු සේවා අපනයනය** | **4,021** | **3,828** | **-0.52** |

**අපනයන කාර්යසාධනය – 2019**





මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මණ්ඩලය මගින් සිදු කරන ලද සමීක්ෂණ

2019 වර්ශයේ වෙළඳ භාණ්ඩ අපනයනය මගින් වන විදේශ විනිමය ඉපයිම, 2018 අගය වූ ඇ.ඩො.බිලි.11.89 ට සාපේක්ෂව 0.42% ක වර්ධනයක් ලබා ඇත. 2019 වර්ශයේ අපනයන ඉපැයීම් වල අගය ඇ.ඩො.බිලි. 11.94 කි. ප්‍රධානතම අපනයනය වන ඇඟළුම් ඇ.ඩො.මිලි. 5,557 දක්වා වැඩි වී ඇත්තේ 2018 වර්ශයේ අගය වන ඇ.ඩො.මිලි. 5,300 ට සාපේක්ෂව 5.24% ක වැඩිවීමක් සමඟය.

මෙම කාලසීමාව තුල තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කලමනාකරණය (5.22%) හා ඉදිකිරීම් (3.08%) හැරුණුවිට, මූල්‍ය සේවා, ප්‍රවාහන හා කාර්ය උපාය සහ ස්වස්ථතා සංචාරක කර්මාන්තය යන සේවාවන් මගින් ලද ඉපයීම් පිළිවෙලින්, 11.98%, 5.91% හා 6.74% ක ප්‍රතිශත වලින් පහත වැටී ඇත. පාස්කු ඉරිදා සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හමුවේ ස්වස්ථතා සංචාරක කර්මාන්තය  දැඩි බලපෑමකට ලක්විය.

## වෙළඳ භාණ්ඩ අපනයනයන් 2017-2019




| | ජන | පෙබ | මාර් | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2017 | 864.7 | 867.8 | 1,041 | 794.7 | 841.2 | 987.3 | 1,015 | 1,000 | 1,011 | 975.6 | 940.9 | 1,019 |
| 2018 | 965.4 | 915.7 | 1,107 | 795.1 | 923.8 | 1,024 | 1,073 | 1,037 | 1,055 | 979.0 | 980.0 | 1,025 |
| 2019 | 1,038 | 981.1 | 1,136 | 798.1 | 961.0 | 1,084 | 998.5 | 1,033 | 952.1 | 977.3 | 978.8 | 1,000 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා රේගුව

### ප්‍රධාන අපනයන ගමනාන්ත 20

2018 හා 2019 වසරවල අපනයන අගයන් පිළිබඳ සන්සන්දනයක් පහත වගුවෙන් දැක්වේ. ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 78% ක්ම මෙම ප්‍රධාන අපනයන ගමනාන්ත 20 කේන්ද්‍ර කොට ගෙන ඇත. ඇමරිකා එක්සත් ජනපදය තනි අපනයන ගමනාන්තයක් වශයෙන් සමස්ත අපනයනයෙන් 26%ක් සඳහා දායක වී ඇත.

| | රට | 2018 ඇ.ඩො.මිලි. | 2019 ඇ.ඩො.මිලි. | % වර්ධනය | 2019 අපනයනයන් සඳහා දායකත්වය (%) |
|---|---|---|---|---|---|
| 1. | එක්සත් ජනපදය | 3,076 | 3,139 | 2.07 | 26.37 |
| 2. | එක්සත් රාජධානිය | 982 | 998 | 1.64 | 8.38 |
| 3. | ඉන්දියාව | 768 | 759 | -1.12 | 6.37 |
| 4. | ජර්මනිය | 612 | 646 | 5.45 | 5.42 |
| 5. | ඉතාලිය | 577 | 531 | -7.95 | 4.46 |
| 6. | බෙල්ජියම | 359 | 352 | -1.97 | 2.96 |
| 7. | නෙදර්ලන්තය | 257 | 301 | 17.00 | 2.53 |
| 8. | ජපානය | 225 | 282 | 25.22 | 2.37 |
| 9. | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 290 | 275 | -5.07 | 2.31 |
| 10. | කැනඩාව | 210 | 240 | 14.57 | 2.02 |
| 11. | චීනය | 231 | 229 | -0.66 | 1.92 |
| 12. | තුර්කිය | 219 | 210 | -4.12 | 1.76 |
| 13. | ඔස්ට්‍රේලියාව | 192 | 200 | 3.92 | 1.68 |

| | රට | 2018 ඇ.ඩො.මිලි. | 2019 ඇ.ඩො.මිලි. | % වර්ධනය | 2019 අපනයනයන් සඳහා දායකත්වය (%) |
|---|---|---|---|---|---|
| 14. | ප්‍රංශය | 197 | 193 | -2.34 | 1.62 |
| 15. | රුසියානු ෆෙඩරේෂනය | 186 | 167 | -10.15 | 1.40 |
| 16. | හොංකොං රාජ්‍යය | 172 | 167 | -3.29 | 1.40 |
| 17. | බංග්ලාදේශය | 135 | 162 | 19.57 | 1.36 |
| 18. | මෙක්සිකෝව | 176 | 160 | -8.95 | 1.35 |
| 19. | ඉරාකය | 145 | 126 | -13.18 | 1.06 |
| 20. | ස්විට්සර්ලන්තය | 131 | 120 | -8.48 | 1.01 |
| | **උප එකතුව** | **9,140** | **9,257** | **1.28** | **77.75** |
| | වෙනත් | 2,749 | 2,683 | -3.65 | 22.19 |
| | **එකතුව** | **11,890** | **11,940** | **0.42** | **100.00** |

**අපනයන කලාප**

2018 හා 2019 වසර වල අපනයනයන් පිලිබඳ සන්සන්දනයක් පහත වගුවෙන් දැක්වේ. සමස්ත අපනයනයෙන් 30% ක් සඳහා ඇමරිකා එක්සත් ජනපදය දායක වන අතර යුරෝපීය සංගමය සමස්ත අපනයනයෙන් 30% ක් සඳහා දායකවේ.

| | කලාපය | 2018 ඇ.ඩො.මිලි | 2019 ඇ.ඩො.මිලි | % වර්ධනය | 2019 සමස්ත අපනයනයන්හි % කොටස |
|---|---|---|---|---|---|
| 1. | යුරෝපිය සංගමය | 3,490 | 3,549 | 1.68 | 29.81 |
| 2. | උතුරු ඇමරිකාව | 3,461.92 | 3,540.42 | 2.27 | 29.65 |
| 3. | දකුණු ඇමරිකාව | 229.85 | 209.55 | -8.83 | 1.76 |
| 4. | ආසියාව | 1,726.77 | 1,812.94 | 4.99 | 15.18 |
| 5. | CIS රටවල් | 290 | 275 | -5.17 | 2.30 |
| 6. | අප්‍රිකානු රටවල් | 250 | 258 | 3.20 | 2.16 |
| 7. | ඕෂනියා රටවල් | 218 | 226 | 3.67 | 1.89 |
| | වෙනත් | 2,223 | 2,069 | -6.94 | 17.33 |
| | **එකතුව** | **11,890** | **11,940** | **0.42** | **100.00** |

**ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

## 1) වෙළඳපළ ප්‍රවේශ සහය වැඩසටහන

දේශීය සමාගම් සඳහා, ගෝලීය අගයදාමයන්ට වඩා හොඳ ප්‍රවේශයක් ලබාදීමට හා අපනයන වෙළඳපලෙහි වඩාත් තරඟකාරී වීම සඳහා ඉවහල් වන වෙළඳ ගැලපුම්කිරීමේ වැඩසටහනෙහි කොටසක් ලෙස 2018 අයවැය මගින් වෙළඳපල ප්‍රවේශ සහය වැඩසටහන අනුමත කරනු ලැබීය. තම වෙළඳපල පුළුල් කිරීම, වෙළඳපල ප්‍රවේශය වැඩි කිරීම, අගය එකතු කිරිම වැඩිදියුණු කිරීම, ඵලදායිතාවය වැඩිකිරීම, ජාත්‍යන්තර තත්වය, පාරිසරික හා අනෙකුත් ප්‍රමිතීන්ට අනුකූලව දේශියව බිහිවූ ලාංකීය සන්නාම උසස් කිරිම, තාක්ෂණය උසස් කිරීම හා තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා උනන්දුවක් දක්වන ව්‍යාපාර දිරිමත් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති අපනයන සංවර්ධන මණ්ඩලය මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

වැඩසටහන කාණ්ඩ දෙකක් යටතේ ක්‍රියාත්මක වනු ඇත.

**1 කාණ්ඩය -** මාස 6ක් තුල නිමකළ යුතු ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සඳහා රු.මිලි. 1.0 ක උපරිමයක් දක්වා සහය වීම.

**2 කාණ්ඩය -** වසර 1-2 තුල නිමකළ යුතු ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සඳහා රු.මිලි. 1.0 ට වැඩියෙන් හා රු.මිලි. 5.0 ක උපරිමයක් දක්වා සහය වීම.

මෙම ව්‍යාපෘතිය 2018 වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වේ. 2019 වසර තුලදී අයදුම්පත් 262ක් ලැබුණු අතර රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදන, විසිතුරු මසුන්, පාවහන්, ලුහු ඉංජිනේරු, පොල් හා පොල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන, ඇඟළුම්, කුළුබඩු හා ඒ සමාන නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, දැව නිෂ්පාදන, බෝට්ටු නිෂ්පාදනය, තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණය, මුද්‍රණ හා සැපයුම් සේවා, පිරිසැකසුම් කරන ලද ආහාර හා තොරතුරු තාක්ෂණය ආදී නිෂ්පාදන අංශ කීපයක් ආවරණය කරමින් අයදුම්පත් 108ක් අනුමත කරනු ලැබීය.

මෙම වැඩසටහන යටතේ යන්ත්‍ර මිලදී ගැනීම, නිරෝධායන පහසුකම් ස්ථාපනය කිරීම, තත්වය වැඩිදියුණු කිරීම, ධාරිතාව වර්ධනය හා වෙළඳපල සංවර්ධනය, තීරුකේත(බාකෝඩ්) පද්ධති ක්‍රියාත්මක කිරීම ආදිය සඳහා පිරිවැය හුවමාරු කිරීමේ පදනම මත සහය ලබාදෙනු ඇත.

| කාණ්ඩය | අනුමත සමාගම් සංඛ්‍යාව | මූල්‍ය සහය ලැබූ සමාගම් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 42 | 29 |
| 2 | 76 | 45 |

## 2) තොරතුරු තාක්ෂණ ආරම්භයන්

තොරතුරු තාක්ෂණ ආරම්භයන් මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශ සංවර්ධනයට මෙන්ම, සමාගම් වලට ඊලඟ මට්ටම දක්වා වර්ධනය වීම, ශ්‍රී ලාංකීය තොරතුරු තාක්ෂණ නිකේතන හා හැකියාවන් පිළිබඳව ගෝලීයව දැනුවත් භාවය ඇතිකිරීම හා වර්ධනය වන ඉල්ලුමට සරිලන පුහුණු ශ්‍රම බලකායක් බිහිකිරීම සඳහා සහයවේ. මෙමගින් 2022 දී ඇ.ඩො.බිලි.5ක ඉලක්කයක් ලඟාකර ගැනීමට දායක වනු ඇත.

එම අංශයේ විශේෂඥ සමාගමක් වන STAX Inc. (උපදේශක සමාගම) අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව 2019 අයවැය යෝජනා වල වන, විශිෂ්ඨයින් බිහිකිරීම, ඩිජිටල් හා ඩිජිටල් නොවන සන්නාමකරණය යන උප ආරම්භයන් ක්‍රියාත්මක කරනු ඇත.

- **"විශිෂ්ඨයින් බිහිකිරීමේ ආරම්භය" (Champion builder initiative)**" යනු රු.මිලි.3.5ක උපරිමයකට යටත්ව තොරතුරු තාක්ෂණ සමාගම් සඳහා සහය වන ප්‍රදානයකි. මේ යටතේ සමාගම් 33ක් අයදුම්පත් යොමුකර තිබූ අතර ඉන් 20ක් සලකා බැලීම සඳහා තෝරාගනු ලැබිය. ඒ අතරින් ව්‍යාවසායන් 14ක් අපනයන සංවර්ධන මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කරනු ලැබිය. ගිවිසුම් අත්සන් කර බැංකු සුරක්ෂණය ඉදිරිපත් කල පසු සෑම සමාගමකටම උපරිමය රු.මිලි.0.7ක් ලෙස 20%ක පෙර ගෙවීමක් ලබාදෙනු ලැබීය. මේ අතරින් සමාගම් තුනක් (3)ක් ඔවුන්ගේ සියළු ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත.

- **ඩිජිටල් සන්නාමකරණ ආරම්භයන්** – ශ්‍රී ලංකාව දැනුම් සේවාවන් සැපයීමේ ගමනාන්තයක් බවට පත්කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකිය ICT/BPM සන්නාමය (IOI – Island of Ingenuity) ප්‍රවර්ධනය කිරීමේ ඩිජිටල් අලෙවිකරණ වැඩසටහනක් සැලසුම් කරමින් පවතී.

  Burgundy and Redhil උපදේශක සමාගම හා එක්ව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ඔස්ට්‍රේලියාව හා ස්කැන්ඩිනේවියානු රටවල් වැනි ඉලක්කගත වෙළඳපලවලවල මෙම වැඩසටහන ආරම්භ කරනු ඇත. 2019 නොවැම්බර් 5වන දින එක් වසරක කාලයක් සඳහා සමාගම සමඟ ගිවිසුම අත්සන් කරනු ලැබිය.

- **ඩිජිටල් නොවන සන්නාමකරණ ආරම්භයන්**

  - ඔක්තෝබර් 6-10 දක්වා ඩුබායිහි පැවති GITEX 2019
    මැද පෙරදිග හා උතුරු අප්‍රිකානු (MENA) කලාපය සඳහා සමාගම් හයක් (06) හඳුන්වාදෙනු ලැබිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වනවිට ඇ.ඩො.මිලි.3.0ක වටිනාකමකින් යුත් ව්‍යාපාර බිහිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව වැඩසටහන තුලදී බද්ධ ව්‍යාපාර සඳහා ඉල්ලීම්

50කට වැඩි ප්‍රමාණයක් ලැබුනු අතර උනන්දුවක් දක්වන්නන් (business leads) 300ක් පමණ හමුවිය.

- ඔක්තෝබර් 29 -31 දක්වා ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පැවති CEBIT 2019 – මෙයට සමාගම් 10ක් සහභාගි විය.
- රට ස්ථානගත කිරීමේ වාර්තාව (Country Positioning Report) යනු ශ්‍රී ලංකාව ගෝලීය සේවා පිහිටුම් දර්ශකය (GSLI) වැනි දර්ශකවල විශ්වාසනීය ගමනාන්තයක් ලෙස පිළිගැනීමට ලක්කිරීම හා ශ්‍රී ලංකාවේ තරඟකාරී වාසිය පිළිබඳව ආයෝජකයින්ට ඒත්තු ගැන්වීම සඳහා වන තරගකාරිත්වය අධ්‍යයනයකි. උපදේශක සමාගම් වෙතින් යෝජනා පහක් (05) ලැබුණි.
- IOI සන්නාමය ප්‍රවර්ධනය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් (AVs) 04ක් නිර්මාණය කරනු ලැබිය. ඒවායේ අවසන් සංස්කරණය 2019 නොවැම්බර් මාසයේදි පළකෙරිණ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ඔවුන්ගේ ප්‍රවර්ධන කාර්යයන් සඳහා මෙම වැඩසටහන් යොදාගනු ඇත.
- ශ්‍රී ලංකාවේ ICT/BPM අංශයේ හැකියාවන් හුවා දක්වමින් තවත් අත් පත්‍රිකාවක් නිර්මාණය කරනු ලැබීය. 2019 මැයි මස ජපානයේ පැවති IT සතියේදී හා 2019 ඔක්තෝබර් මාසයේදී පැවති GITEXහිදි මෙම පත්‍රිකා බෙදා දෙනු ලැබීය.

- **කුසලතා සංවර්ධන ආරම්භයන්**

කලාපීය IT/BPM ව්‍යවසායකයින් සඳහා ඇති ගෝලීය අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීම හා ඔවුන්ට ඊළඟ මට්ටම දක්වා වර්ධනය වීම සඳහා සහය විමට සමුළු හා ව්‍යාපාරික සායන මාලාවක් පවත්වනු ලැබීය. මෙම ප්‍රයත්නයෙහි එක් අංගයක් ලෙස, 2019 නොවැම්බර් 20 සිට 21 දක්වා ඌව තොරතුරු තාක්ෂණ සතිය 2019 සාර්ථකව පවත්වනු ලැබීය. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර IOI සන්නාමය ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ ප්‍රවර්ධන සඳහා සන්නාමය යොදාගැනීම පිළිබඳ දැනුවත් කිරීම සිදු කෙරිණි.

- **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / බී.පී.එම් නව ව්‍යාපාර සඳහා කුලී වියදමෙන් 50% ක් ලබා දීම**

මෙම වැඩසටහන හරහා ICT/BPM ව්‍යාපාර ආරම්භ කරන්නන් සඳහා රජය මගින් බදු කුලියෙන් 50%ක සහනාධාරයක් ප්‍රදානය කිරීම නිසා ඔවුන්ට අවශ්‍ය වැඩපරිශ්‍රයන් ලබාගැනීමට හැකිවේ. ආරම්භක ව්‍යාපාර වෙත ඔවුන්ගේ බදුකුලී වියදමෙන් 50%ක් මාස 24ක් දක්වා ලැබෙනු ඇත. දැනට මූල්‍ය සහය සඳහා ව්‍යාපාර 05ක් ඉල්ලුම්කර ඇති අතර අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එම අයදුම්පත් සමාලෝචනය කිරීමේ යෙදී සිටී.

- **විශ්ව විද්‍යාල විෂය මාලාව සඳහා කෙටිකාලීන පාඨමාලා හඳුන්වාදීම** - ඒ අනුව තෝරාගත් විශ්ව විද්‍යාල හරහා තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ට වෙළඳපල ඉල්ලුමක් ඇති තොරතුරු තාක්ෂණ නිපුණතාවන් ලබාගැනීම සඳහා නව පාඨමාලා හඳුන්වාදෙනු ලැබීය.

- කොළඹ විශ්ව විද්‍යාලය විසින් ශිෂ්‍යයින් 29 දෙනෙකු සඳහා දත්ත විද්‍යා පාඨමාලාවක් නිමකර ඇති අතර 2019 ඔක්තෝබර් ආරම්භ කරන ලද දෙවන කණ්ඩායම සඳහා ශිෂ්‍යයින් 37 දෙනෙකු ඇතුලත්ව ඇත.
- SLIITආයතනය විසින් ශිෂ්‍යයින් 09 දෙනෙකු සඳහා Internet of Things (IOT) පාඨමාලාව ආරම්භ කර ඇත.
- මොරටුව විශ්ව විද්‍යාලය මගින් දත්ත විශ්ලේෂණ පාඨමාලාව පවත්වනු ඇත. - අයවැය යෝජනාව අනුව ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් සෑම ශිෂ්‍යයෙකුටම පාඨමාලා ගාස්තුවෙන් 50%ක සහනාධාරයක් ලබාදේ.

## 3) බෝට්ටු නිෂ්පාදනය - යටිතල පහසුකම් ඇති කිරීම හා නියාමන රාමුවක් වැඩිදියුණු කිරීම

### නියාමන රාමුවක් වැඩිදියුණු කිරීම

බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය, රටේ යාත්‍රා පැදවීමේ හා නාවික ක්‍රියාකාරකම් නියාමනය හා ශ්‍රී ලංකාවේ මුහුදට තව තවත් විදේශීය යාත්‍රා ආකර්ෂණය කර ගැනීම සඳහා වැඩි යාත්‍රා ප්‍රමාණයක් හා බලපත්‍රලාභී මෙහෙයුම් සඳහා උනන්දු කරවීමට අමතරව යාත්‍රා පදනම් සංචාරක කර්මාන්තය නියාමනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ හා වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ හා වෙනත් රජයේ හා පෞද්ගලික ආයතන වල සහයෝගීතාවය ඇතිව කර්මාන්තයේ සමස්ථ අගයදාම (ධීවර බෝට්ටු හැර) ආවරණය කරමින් නියාමන රාමුවක් වැඩිදියුණු කිරීම ආරම්භ කරනු ලැබීය. මෙම වැඩිදියුණු කරනු ලැබූ නියාමන රාමුව වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් හා තාක්ෂණික සමාලෝචන කමිටුව විසින් ඇගයුම් කරමින් පවතී.

### යටිතල පහසුකම් ස්ථාපනය

බෝට්ටු නිෂ්පාදන කිරීමේ (විශේෂයෙන්ම මීටර් 20ට වැඩි යාත්‍රා), නවතා තැබීමේ (නැංගුරම් පොලවල්/නිකේතන වරාය), දියත් කිරීමේ හා පරීක්ෂා කිරීමේ (ලිහිසුම් මග/දියත් කිරීමේ ස්ථාන) හා අළුත්වැඩියාවන් සඳහා තටාකාංගන පහසුකම් වැනි යටිතල පහසුකම් නොමැතිකම නිසා යාත්‍රා කිරීමේ/ නාවුක කටයුතු සිදුවන්නේ ඉතා මඳ වශයෙනි.

බෝට්ටු නිෂ්පාදකයන් සඳහා බෝට්ටු නවතා තැබීම, දියත් කිරීම් හා පරීක්ෂා කිරීමේ පහසුකම් සැලසීමට දියකඩනයක් ඉදිකිරිමට සුදුසු ස්ථානයක් ලෙස කප්පරතොට (වැලිගම) හඳුනාගෙන තිබේ. පාරිසරික වාර්තා හැර පූර්ව ශක්‍යතා වාර්තා, ශක්‍යතා වාර්තා හා විස්තරාත්මක සැලසුම් සම්පූර්ණ කර තිබේ. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව (CCD) විසින් නිකුත් කරන ලද නිර්ණය විෂයන්ට (TOR) අනුව, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIA වාර්තාව) සකස් කල යුතු අතර ඒ සඳහා මාස හයකට වැඩි කාලයක් ගතවේ. ව්‍යාපෘති දිගු කිරීම හා 2020 හා 2021 වසර සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම් සඳහා අනුමැතිය ලබාගැනීමට ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සමඟ ඉදිරිපත් කළ යුතු ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ද කෙටුම්පත් කර තිබේ.

## 4) බහු ජාතික සහයෝගිතා වැඩසටහන

ශ්‍රී ලාංකීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම් වලට ගෝලීය බහුජාතික සැපයුම් ජාල සමඟ සම්බන්ධවීමට, බද්ධ ව්‍යාපාර ඇතිකර ගැනීමට හා ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කාර්යන් හි ගිවිසුම්ගත නිෂ්පාදකයින් ලෙස නිරත වීමට හැකිවන සේ G2G හෝ G2B වැඩසටහන් හරහා ශ්‍රී ලංකාවට බහුජාතික ගෝලීය ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් සමාගම් තුන (3) සිට පහ (5) දක්වා ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන සකස් කර ඇත.

2019.02.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විදේශීය උපදේශකයින්ගේ සේවය ලබාගැනීමෙන් තොරව බහුජාතික සහයෝගිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයට හා ආයෝජන මණ්ඩලයට බලය ලබාදෙනු ලැබීය. වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා PricewaterhouseCoopers (PwC Sri Lanka) ආයතනය තෝරාගත් අතර, ගිවිසුම අත්සන් කිරීම සඳහා ප්‍රසම්පාදන ඒකකයේ අනුමැතිය ලබාගත යුතුව ඇත.

## 5) වාණිජ වේදිකාවක් ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන හා සේවාවන් ජාත්‍යන්තර වශයෙන් එක් වේදිකාවක ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකාවෙන් නිෂ්පාදන හා සේවා ලබාගැනීමට අපේක්ෂිත ගැනුම්කරුවන් හා වත්මන් ගැනුම්කරුවන්ට ඒ සඳහා පහසුකම් සැලසීමට හා ශ්‍රී ලාංකීය ව්‍යවසායයන්ට අදාල වෙළඳ තොරතුරු නියමිත වෙලාවට ලබාගැනිම සඳහා වාණිජ ප්‍රවර්ධන වේදිකාවක් (TPP) නිර්මාණය කරනු ලැබීය.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රවර්ධනය වෙනුවෙන් ශ්‍රී ලංකිය නිෂ්පාදන අන්තර්ජාලය හරහා අලෙවිකිරීමට හා B2B ගැලපුම් සඳහා පහසුකම් සැලසීමට මෙම වේදිකාවට e-MARKETPLACE ඇතුලත් කරනු ලැබිය. මෙම වෙබ් අඩවිය මගින් ප්‍රධාන සාධක පරාසයක් මත විදේශිය ගැණුම්කරුවන් හරහා ශක්‍යතාවයක් ඇති වෙළඳ හවුල්කරුවන් සොයාගැනීම හා හඳුනාගැනීම සඳහා පහසුකම් සැලසේ. ජාත්‍යන්තර යහපැවතුම් වලට අනුව, පරිශිලකයින්ට අපනයනකරුවන් හා ගැනුම්කරුවන් පිළිබඳ විස්තර

මෙන්ම සොයා බැලීමේ සාධක වලට ප්‍රතිචාර ලෙස ඔවුන් උනන්දුවක් දක්වන විෂයන් පිළිබඳ තොරතුරු මෙම වෙබ් අඩවියේ ඇතුලත් වේ. QCBS ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ජාලගතකිරීම (hosting) හා ඊ-ප්‍රවර්ධනය සඳහා සේවා සැපයුම්කරුවකු තෝරාගෙන ඇත. දැනට වෙබ් පෝටලය නිර්මාණය කිරීම අවසන් අදියරේ පවතී.

## 6) ශ්‍රී ලාංකීය සමාගම් වලට ඉන්දියානු හා චින වෙළඳපල සඳහා ප්‍රවේශවීමට සහයවීම (වෙළඳ මධස්ථාන ස්ථාපනය කිරීම)

අපනයන සංවර්ධන මණ්ඩලය, පෞද්ගලික අංශය හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය (MODSIT) සමග සාකච්ඡා කර පහත දැක්වෙන පරිදි කවුළු 2ක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

i. හඳුනාගත් ශ්‍රී ලාංකීය අපනයන නිෂ්පාදන සඳහා චීන වෙළඳපල ප්‍රවේශ උපායමාර්ග සකස් කිරීම හා චීනය සඳහා අපනයන් වැඩිකිරීම සඳහා ව්‍යාපාරික සම්බන්ධතා ඇතිකිරීම.

ii. 'ඉන්දීය වෙළඳපල ප්‍රවේශ අධ්‍යයනය' වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලාංකිය ව්‍යාපාර ඉන්දියාව දක්වා රැගෙනයාම සඳහා ව්‍යාපාරික සම්බන්ධතා ඇති කිරීම.

වැඩසටහනෙහි විශේෂ අරමුණු පහත දැක්වේ;

- චීන හා ඉන්දීය වෙළඳපලට පිවිසීමේ විභව්‍යතාවයක් ඇති ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධාන අංග ඇතුලත් දැනුවත් කරනු ලැබූ හා ප්‍රත්‍යක්ෂ දත්ත මත පදනම් වූ අධ්‍යයනයක් සිදුකිරීම.

- ශ්‍රී ලාංකිය සමාගම් වලට චීන හා ඉන්දීය වෙළඳපලට පිවිසීම සඳහා සම්බන්ධතා ඇති කිරීම.

චීන අධ්‍යයනය සඳහා වන තාක්ෂණ ඇගයුම් කමිටුව විසින් යෝජකයින් දෙදෙනා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳ අමතර තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ උපදෙස් අපේක්ෂා කෙරේ. ඉන්දීය අධ්‍යයනය සඳහා වන තාක්ෂණ ඇගයුම් කමිටුව, ලංසු ඉදිරිපත් කරන ලද විවිධ සමාගම් හයක් මගින් ලැබුණු යෝජනා සඳහා ලකුණු ලබාදීමේ අවසන් අදියරේ සිටී.

## 7) පෞද්ගලික අංශය මගින් ටයර් පරීක්ෂාකිරීමේ හා වැඩිදියුණු කිරීමේ පර්යේෂණ පහසුකම් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම

"ටයර් පරීක්ෂා කිරීම හා මූලාකෘති නිර්මාණය සඳහා අංගසම්පූර්ණ පර්යේෂණ පහසුකම් ස්ථාපනය" පිළිබඳ යෝජනාවක් 2019 ජාතික අයවැය සඳහා ඇතුලත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධන

උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය (MODSIT) වෙත 2019 වසර සඳහා රු.මිලි.50ක ආරම්භක අයවැය ප්‍රතිපාදනයක් වෙන්කරනු ලැබීය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වන රබර් පර්යේෂණ ආයතනය (RRI) රබර් කර්මාන්තයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා ස්ථාපිත රජයේ වගකිවයුතු ආයතනය වන අතර එහි දැනටමත් රබර් තාක්ෂණවේදීන් කීපදෙනෙකු පුහුණු කර ඇති බැවින් හා එය රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය මූලික පර්යේෂණ පහසුකම් වලින් සමන්විත බැවින් ද මෙම මධ්‍යස්ථානය රබර් පර්යේෂණ ආයතනයේ ස්ථාපනය කිරීමට තීරණය කරනු ලැබීය.

ඒ අනුව, වසර තුල සිදුකිරීම සඳහා පහත ක්‍රියාකාරකම් ක්‍රියාකාරකම් හඳුනා ගැනිණ:

(i). උසස් මට්ටමේ ටයර් පර්යේෂණ උපකරණ හා පොලිමර් පුස්තකාල මාදුකාංගය (polymer library software) මිලදී ගැනීම.
(ii). ප්‍රතීතකරණ අවශ්‍යතාවන්ට අනුකූලවීම සඳහා දැනට පවතින පර්යේෂණාගාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
(iii). විද්‍යාගාර ප්‍රතීතකරණය සඳහා පිටතින් උපදේශක සේවා සපයාගැනීම.

පාරිසරික හා සෞඛ්‍යය සාධක පිළිබඳ සැලකිළිමත් බව වැඩිවීම නිසා සංවර්ධිත රටවල් බොහොමයක් ටයර් කර්මාන්තය ඇතුළු රබර් නිෂ්පාදිත නිපදවීමේ කර්මාන්තයේ දී භාවිතා කරන රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ විවිධ නීති හා සීමාවන් හඳුන්වාදී ඇත (උදා - රසායන ද්‍රව්‍ය ලියාපදිංචි කිරීම, ඇගයීම, බලය ලබාදීම හා සීමාකිරීම - 69 වන යෝජනාව). එමනිසා, ජාත්‍යන්තර වෙළඳපලෙහි පිළිගනු ලබන පරිදි අවශ්‍ය තත්ව සහතික නිකුත් කිරීම සඳහා මෙම පරීක්ෂාකිරීමේ විද්‍යාගාර ප්‍රතීතකරණය කර එකී අවශ්‍යතාවයන්ට අනුකූලව හැකියාවන් හා පහසුකම් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍යව ඇත. නමුත් මෙම පරීක්ෂණ සිදුකිරීම සඳහා ප්‍රතීතකරණය කරන ලද විද්‍යාගාර ශ්‍රී ලංකාවේ නොමැති අතර කර්මාන්තයට විදේශිය ප්‍රතිතකරණය කරන ලද පරීක්ෂාකිරීමේ පහසුකම් මත යැපීමට සිදුව තිබේ.

විදේශයන් මගින් මෙම සේවාවන් ලබා ගැනිම සඳහා තාක්ෂණික හැකියාවක් හෝ මූල්‍යමය ශක්තියක් නොමැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ඔවුන්ගේ නිෂ්පාදනයන් හි තත්ව ප්‍රමිතින් ඉහල නැංවීමේදී හා ඉහල අගයක් එක්කළ නිෂ්පාදනයන් කරා යාමේදී ඇතිවන බාධක හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපලෙහි තරඟ කිරීම අසීරුව ඇත.

මෙම ව්‍යාපෘතියෙන් ලබාදෙන පහසුකම් මගින් දේශීය රබර් නිෂ්පාදකයින්ට අදාල අවශ්‍යතා පරීක්ෂාකිරීම සඳහා වැයවන විදේශ විනිමය අඩු කිරීමට මෙන්ම ඔවුන්ට ගෝලීය වෙළඳපලෙහි වඩාත් තරඟකාරී වීමට හැකිවේ. මෙම පහසුකම් යොදාගනිමින් පර්යේෂණ හා සංවර්ධන සිදුකිරීමට හැකිවීම මගින් ගෝලීය වෙළඳපලෙහි රඳා පැවතීමට හෝ රබර් නිෂ්පාදන වෙළඳපල කොටස වැඩිකිරීමට මග සලසමින් වඩාත් උසස්, අඩු වියදම්, නව හෝ ඉහල ඉල්ලුමක් ඇති නිෂ්පාදන සඳහා යොමු කෙරේ.

දැනට විද්‍යාගාර යටිතල පහසුකම් සංවර්ධනය හා උපදේශක සේවා ලබාගැනීම සඳහා ලැබුණු මිල ගණන් ඇගයීම්කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වෙත තාක්ෂණ කමිටු වාර්තා ඉදිරිපත් කර ඇති අතර පිරිනැමීම් ලිපි නිකුත් කිරීමට අපේක්ෂාවෙන් සිටී. මෙම කාලය තුල විද්‍යාගාර ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යාගාර යටිතල පහසුකම් සංවර්ධන කටයුතු නිමකර ඇත. උපකරණ හා මෘදුකාංග මිලදී ගැනීම සඳහා ඇණවුම් කර ඇති අතර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ලබන වසරේ සිදුකරනු ඇත.

## ජාතික අපනයන උපායමාර්ග (NES)

ජාතික අපනයන උපායමාර්ගයන්හි දැක්ම - **"ශ්‍රී ලංකාව නවෝත්පාදන හා ආයෝජන මගින් මෙහෙයවනු ලබන අපනයන මධ්‍යස්ථානයක් බවට පත්කිරීම"**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය හා එක්ව ITC ආයතනයේ තාක්ෂණ සහය ඇතිව පස් වසරක් (2018-2022) සඳහා වන ජාතික අපනයන උපායමාර්ග (NES) සකස් කරනු ලැබූ අතර එය 2018 ජූලි මාසයේදී ආරම්භ කරන ලදී. මෙහිදී 2022 වනවිට ඇ.ඩො.බිලියන 22ක අපනයන ඉලක්කයක් ළඟාකර ගැනීමේ හා අපනයන නිෂ්පාදන විවිධාංගකරණය කිරීමේ අරමුණ ඇතිව තොරතුරු තාක්ෂණය, ස්වස්ථ සංචාරක කර්මාන්තය, කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය, බෝට්ටු නිෂ්පාදනය, පිරිසැකසුම් කරන ලද ආහාර හා පානවර්ග හා ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් උපාංග යන ඉලක්කගත අංශ හයක් (06) හා වෙළඳ සහාය කාර්යයන් 04ක් එනම්, වෙළඳ තොරතුරු හා ප්‍රවර්ධනය, ජාතික තත්ව යටිතල පහසුකම්, සැපයුම් සේවා හා නවෝත්පාදන හා ව්‍යවසායකත්වය හඳුනාගෙන ඇත.

**ජාතික අපනයන උපායමාර්ගයන්හි ඉලක්කගත අංශ [2018-2022]**

**2019 දී NES ඉලක්කගත අංශ මගින් ලබාදුන් 22.3 % දායකත්වය**
**[2018 20.8% හා සැසඳීමේදී]**

**සේවා**

වර්ධනය
**තොරතුරු තාක්ෂණ**
**ඇ.ඩො.මිලි.1,280**
**[2018**
**ඇ.ඩො.මිලි.1,035]**

හැකිලීම
**ස්වස්ථ සංචාරක කර්මාන්තය**
**ඇ.ඩො.මිලි. 173**
**[2018**
**ඇ.ඩො.මිලි 193]**

**කාර්මික**

හැකිලීම
**බෝට්ටු නිෂ්පාදනය**
**ඇ.ඩො.මිලි.65**
**[2018**
**ඇ.ඩො.මිලි.27]**

වර්ධනය
**විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපාංග**
**ඇ.ඩො.මිලි.381**
**[2018**
**ඇ.ඩො.මිලි.410 ]**

**කෘෂිකාර්මික**

හැකිලීම
**පිරිසැකසුම් කරන ලද ආහාර හා පාන වර්ග**
**ඇ.ඩො.මිලි.442**
**[2018**
**ඇ.ඩො.මිලි.443]**

වර්ධනය
**කුළුබඩු හා සාන්ද්‍ර ද්‍රව්‍ය**
**ඇ.ඩො.මිලි.313**
**[2018**
**ඇ.ඩො.මිලි.361]**

## අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පහසුකම් සැලසීම

අපනයනකරුවන් සඳහා ව්‍යාපාරික පරිසරයක් ඇතිකිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතාවයන්ට අනුව ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන හා සේවාවන් සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් වැඩසටහන් ගණනාවක් ආරම්භ කරනු ලැබීය. තවද, මණ්ඩලය විසින් වෙළඳපල හඳුනා ගැනීම, ප්‍රවේශවීම, වැඩිදියුණු කිරීම හා විවිධාංගිකරණය සඳහා විශේෂිත සේවාවන් ලබාදෙන අතර විශේෂයෙන්ම පළාත් මට්ටමින් අපනයන ඉලක්කගත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය සඳහා සැපයුම් ජාලවල කාර්යක්ෂමතාවය වැඩිකිරීමට පහසුකම් සලසනු ලැබිය. සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පහත තේමාවන් යටතේ දැක්වේ:

1. **සැපයුම් හා නිෂ්පාදන සංවර්ධනය**
2. **තත්වය, ප්‍රමිතිය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම්**
3. **වෙළඳපල සංවර්ධනය හා ප්‍රවර්ධනය**
4. **නිෂ්පාදන සන්නාමකරණය හා ස්ථානගත කිරීම**
5. **නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන**
6. **වෙළඳාම සඳහා පහසුකම් සැලසීම හා තොරතුරු සැපයීම**

## 1. සැපයුම් හා නිෂ්පාදන සංවර්ධනය

### 1.1. විදේශිය වැඩසටහන්

- **තායිලන්තයේ පැවති විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා තාක්ෂණ නිරාවරණ වැඩසටහන (2019 ඔක්තෝබර්)**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැලේසියාවේ INFOFISH හා තායිලන්තයේ ධීවර දෙපාර්තමේන්තුව සමඟ එක්ව, විසිතුරු මසුන් බෝ කරන්නන් /අපනයනකරුවන් වෙනුවෙන්, තායි මත්ස්‍ය වගාකරුවන් විසින් දැනට භාවිතා කරනු ලබන නව තාක්ෂණික ක්‍රම සඳහා නිරාවරණය වීමේ අවස්ථාව ලබාදීමේ අරමුණ ඇතිව තාක්ෂණ නිරාවරණ වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය.

මේ සඳහා ශ්‍රී ලංකාවෙන් සමාගම් විසි දෙකක් (22) සහභාගි වූ අතර තෙදිනක් පුරා මත්ස්‍ය ගොවිපල 06ක් වෙත සංචාරය කරනු ලැබීය. සහභාගි වූවන්ට නව ඇසුරුම්කරණ තාක්ෂණයන්, බෝ කිරීමේ ක්‍රම,

ආහාර දීමේ ශිල්පීය ක්‍රම, ගොවිපලවල ජෛව ආරක්ෂාව පවත්වාගෙන යාම, ගොවිපළ කළමනාකරණය, නව අපද්‍රව්‍ය පවිත්‍රකිරීමේ පද්ධති ආදීය පිළිබඳ දැනුම ලබාගැනීමට හැකිවිය.

- **නව බිම්මල් වර්ගයක් (Milky Mushroom) වගාකිරීමේ තාක්ෂණය ලබාගැනිම සඳහා ඉන්දියාවේ පැවති තාක්ෂණ පුහුණුව**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙරට බිම්මල් කර්මාන්තය තවදුරටත් සංවර්ධනය වෙනුවෙන් රටේ බිම්මල් වගාකරුවන් සඳහා ඉහල ඵලදාවක් ලබාදෙන නව බිම්මල් වර්ග හා ඉහල ඵලදාවක් සහිත බීජාණු හඳුන්වාදීම මඟින් ඔවුන්ගේ නිෂ්පාදන එකතුව පුළුල් කිරීම සඳහා බිම්මල් සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ (MDTC) තාක්ෂණ හැකියාවන් පුළුල් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.
එබැවින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව ශ්‍රී ලංකිකයන් 04 දෙනෙකු සඳහා ඉන්දියාවේ නව දිල්ලියේ ජාතික උද්‍යාන වගා පර්යේෂණ හා සංවර්ධන පදනමේ දී (NHRDF) තාක්ෂණ පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබීය. දැනට බිම්මල් සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය විසින් මෙම බිම්මල් වර්ගයේ බීජ නිපදවීම ආරම්භකර ඇති අතර ඒවා වාණිජකරණය කරමින් පවතී.

## 1.2. දේශීය වැඩසටහන්

- **කුඩා හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් සඳහා වසර තුනක ඒකාබද්ධ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන - නිර්මාණ, නිෂ්පාදන හා වෙළඳපල සංවර්ධනය (2019 මැයි මාසයේදි ආරම්භ කරනු ලැබීය)**

මෙම අංශයේ නියැලි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ අභිවෘද්ධියට බාධකයක්ව පවතින ප්‍රධාන සාධක දෙක වන්නේ, ජාත්‍යන්තර වෙළඳපල සඳහා වෙනස් ලෙස නිර්මාණ යොදාගැනීමේ වාසි පිළිබඳ දැනුමක් නොමැතිවීම හා ජාත්‍යන්තර වෙළඳපලෙහි ඉහලම කාණ්ඩය ආකර්ෂණය කරගැනිම සඳහා විශිෂ්ඨ නිර්මාණ කිරීමේ හැකියාව ඇති නිර්මාණකරුවන් නොමැති වීමයි.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2019 වසරේදි කුඩා හා මධ්‍ය පරිමාණ ස්වරණාභරණ නිෂ්පාදකයින්ගේ නිර්මාණ හා නව ශිල්පීය ක්‍රම/තාක්ෂණයන් යාවත්කාලින කිරීම, නව ශිල්පීය ක්‍රම/ තාක්ෂණයන් උත්ශ්‍රේණිගත කිරීම හා හඳුන්වාදීම සහ ජාත්‍යන්තරව භාවිතාකරනු ලබන නවතම වෙළඳපල උපායමාර්ග පිළිබඳව දැනුම වැඩිදියුනු කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ස්වරණාභරණ නිෂ්පාදකයින් දසදෙනෙකුගෙන් යුත් තෝරාගත් කණ්ඩායමක් සඳහා වසර තුනක ඒකාබද්ධ නිර්මාණ/නිෂ්පාදන හා වෙළඳපල සංවර්ධන වැඩසටහනක් දියත්කරනු ලැබීය.

අදියර තුනකින් සමන්විත වැඩසටහන ජාත්‍යන්තර හා දේශිය විශේෂඥයින් සමගින් 2019 මාර්තු මාසයේදී ආරම්භ විය. නිර්මාණ වැඩිදියුණු කිරීමේ අදියරේ දී වැඩමුළු තුනක් පැවැත්වූ අතර නිර්මාණ විශේඥයින් විසින් සහභාගි වූවන් සඳහා දැනට පවතින නිර්මාණ වැඩිදියුණු කරගැනීම සඳහා උපදෙස් ලබාදෙනු ලැබූ අතර නව නිර්මාණ සිදුකිරීම සඳහා සහය ලබාදෙනු ලැබීය.

නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ අදියරේ දී (නිෂ්පාදන ශිල්පීය ක්‍රම/ ඇසුරුම්කරණය හා ප්‍රදර්ශනය කිරීම) වැඩමුළු දෙකක් පැවැත්වූ අතර එයට සහභාගි වූවන්ට කඩුවෙල පිහිටි මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනයේ (GJRTI) පිහිටි අංග සම්පූර්ණ ස්වර්ණාභරණ වැඩපලේ දී ලෝහ ශිල්ප හා එනමල් කිරීම පිළිබඳ පුහුණුවක් ලබාදෙනු ලැබීය. මීට අමතරව නව නිර්මාණාත්මක ඇසුරුම්කරණ වලට අනුගත වීම සඳහා සන්නාමකරණය හා ඇසුරුම්කරණය පිළිබඳ එක් දින වැඩමුළුවක් පවත්වනු ලැබූ අතර එහිදී ඔවුන්ටම අයත් සන්නාම නිර්මාණය කරගැනීම, විවිධ ඇසුරුම්කරණ ශිල්පිය ක්‍රම ආදිය පිළිබඳ දැනුම ලබාදෙනු ලැබීය. සහභාගි වූවන් තනි තනිවම සමාලෝචනය කරනු ලැබූ අතර නව නිර්මාණ එකතුව සඳහා ඔවුන්ටම අයත් සන්නාම වැඩිදියුණුකර ගැනීම සඳහා සහය වනු ලැබීය.

වෙළඳපල සංවර්ධන අදියර වසර තුනක් ඉදිරියට ක්‍රියාත්මක වන අතර ආරම්භක අදියරේ දී තෝරාගත් සහභාගිවූවන් දසදෙනාම සඳහා ඔවුන්ගේ නව නිර්මාණ ස්වර්ණාභරණ එකතුව 2019 FACETS ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ දැක්මේ දී ආයෝජන මණ්ඩල ප්‍රදර්ශන කුටියේ ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ පහසුකම් හා ප්‍රදර්ශන කුටි මෙන්ම ප්‍රදර්ශන කැබිනෙට්ටු, අවශ්‍ය උපකරණ වැනි ප්‍රදර්ශන පහසුකම් සපයාදීම මගින් සහය දක්වනු ලැබීය.

- **NAQDA හා NARA ආයතන සමග සහයෝගීතාවයෙන් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා නව තාක්ෂණයන් පිළිබඳ වැඩමුළුව (2019 ජුනි)**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ (NARA), ජාතික ජලජීවි වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) හා සර්ම කලාපිය සජීවී මත්ස්‍ය අපනයනකරුවන්ගේ සංගමයේ සහයෝගීතාවය ඇතිව නව බෝ කිරීම් තාක්ෂණයන්, රෝග පාලනය හා සජීවී මත්ස්‍ය ආහාර නිෂ්පාදනය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව කර්මාන්තයේ නව වැඩිදියුණු කිරීම් පිළිබඳව විසිතුරු මසුන් බෝකරන්නන්, නිෂ්පාදකයින් හා අපනයනකරුවන් හතලිස් දෙනෙකු දැනුවත්කිරීම වෙනුවෙන් 2019 ජූනි මාසයේදී දින තුනක තාක්ෂණ පැවරුම් වැඩසටහනක් සංවිධානය කරනු ලැබිය.
මෙම තෙදින වැඩමුළුවේදී බී ෂිරින්ප් හා නියෝන් ටෙට්රා බෝ කිරීමේ තාක්ෂණය, ජානමය මෙහෙයවීම, රෝග පාලනය, සජිවි මත්ස්‍ය ආහාර නිෂ්පාදන තාක්ෂණය, ජෛව-ආරක්ෂක ක්‍රියාමාර්ග, විසිතුරු මත්ස්‍ය වගාව පිළිබඳ නව තාක්ෂණයන්, විසිතුරු මත්ස්‍ය වගා ගොවිපල කළමණාකරනය හා අපනයන වෙළඳපල පිලිබඳව සහභාගි වූවන් දැනුවත්කරනු ලැබීය.

- **ජීවි ශාක හා කැපූ ශාක සැපයුම සංවර්ධනය කිරීමේ වැඩසටහන (ජූලි 2019)**

පළාත් මට්ටමින් වත්මන් අපනයනකරුවන්ගේ සැපයුම් පදනම වැඩිකිරීම සඳහා 2019 ජූලි මාසයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ දී ජීවි ශාක හා කැපූ ශාක පිළිබඳ වැඩමුළුවක් පැවැත්විණ.

## 2. තත්වය, ප්‍රමිතිය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම්

### 2.1. විදේශීය වැඩසටහන්

- **තාක්ෂණය - චීනයේ පැවති ඇඟළුම් කර්මාන්තය උත්ශ්‍රේණිගත කිරීමේ වැඩසටහන**

නවතම තාක්ෂණික වැඩිදියුණු කිරීම් පිළිබඳව ඉගෙන ගැනීම සඳහා ඇඟළුම් සමාගම් දෙළහකට චීනයේ සංචාරය කිරීම සඳහා සහය ලබාදෙනු ලැබීය. සමාගම් තුනක් විසින් යන්ත්‍ර ආනයනය කරනු ලැබීය.

- **වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තය පිළිබඳව ඉන්දියාවේ මුම්බායි නගරයේ පැවති තාක්ෂණ පුහුණු හා නිරාවරණ වැඩසටහන (2019 ඔක්තෝබර් මස)**

ගෝලීය අගයදාමයන් හා එක්වීම මගින් ජාත්‍යන්තර වෙළඳපලෙහි වැඩිදියුණු කළ යුතු හා ප්‍රවර්ධනය කළ යුතු අංශයක් ලෙස වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තය හඳුනාගෙන තිබේ.

අපනයන සංවර්ධන මණ්ඩලය ඉන්දියාවේ මුම්බායි නගරයේ ශ්‍රී ලංකා කොන්සල් ජනරාල්වරයාගේ සහය ඇතිව කර්මාන්තයේ අවශ්‍යතා, ජාත්‍යන්තර ප්‍රමිතීන්, නව තාක්ෂණික වැඩිදියුණු කිරීම් පිළිබඳ මූලික දැනුම ලබාදීම හා ඒ සඳහා නිරාවරණය වීමේ අවස්ථාව ලබාදීම අරමුණු කරගනිමින් ඉන්දීය වාහන පර්යේෂණ සංගමයේ (ARAI) තාක්ෂණ පුහුණු හා නිරාවරණ වැඩසටහනක් වන **උසස් ද්‍රව්‍ය හා විදහා දැක්වීම සහ පරීක්ෂා කිරීමේ හා සහතිකකරණය** පිළිබඳ වැඩසටහනක් 2019 ඔක්තෝබර් 14 සිට 19 දින දක්වා ඉන්දියාවේ දී පැවැත්වීමට සංවිධානය කරනු ලැබීය. එම සංගමය, ඉන්දීය රජයේ බැර කර්මාන්ත හා රාජ්‍ය ව්‍යාපාර අමාත්‍යාංශයට අනුබද්ධ ස්වාධීන ආයතනයකි.

වැඩසටහන සඳහා සමාගම් අටක් (08) සහභාගී විය. සංගමය විසින් දින පහක් පුරා පැවැත්වූ පුහුණු වැඩසටහනට දේශන, පරීක්ෂා කිරීමේ විද්‍යාගාර හා වාහන/වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තශාලා වෙත සංචාරය කිරීම් ද ඇතුලත් විය.

සහභාගී වූවන්ට ටාටා මෝටර්ස්, ස්කෝඩා ඔටෝ වොක්සගන් ඉන්දියා (ප්‍රයිවට්) ලිමිටඩ් හා ඉන්දියාවේ පුනේ පිහිටි මහින්ද්‍රා ඇන්ඩ් මහින්ද්‍රා ලිමිටඩ් වැනි ස්ථායි සමාගම් සඳහා සංචාරය කිරීමේ අවස්ථාව ද හිමිවිය.

සහභාගි වූවන්ට තම නිෂ්පාදන සාම්පල වැඩිදියුණු කිරීම සඳහා ඉන්දීය වාහන පර්යේෂණ සංගමයේ පරීක්ෂා කිරීමේ පහසුකම් ලබාගැනීම සඳහා සම්බන්ධතා ගොඩනගා ගැනීමට හැකි වූ අතර එම සමාගම් වලට ගෝලීය අගයදාමයන්ට එක්වීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රමිතිකරණය සඳහා ආයතන තුලම පරීක්ෂා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා සහය වීමට අපනයන සංවර්ධන මණ්ඩලය සැලසුම් කරමින් සිටී.

### 2.2. දේශිය වැඩසටහන්

- **ශ්‍රී ලංකිය ටයර් නිෂ්පාදන කර්මාන්තය සඳහා ටයර් සම්මිශ්‍රණය හා ටයර් තාක්ෂණය පිළිබඳ වැඩමුළුව (2019 ජූලි)**

කර්මාන්තයේ ඉල්ලීම අනුව, ගෝලිය ටයර් කර්මාන්තයේ තාක්ෂණික වැඩිදියුණු කිරීම් පිළිබඳ දැනුම උත්ශ්‍රේණිගත කිරීම සඳහා ඉන්දීය තාක්ෂණ විශේෂඥයෙකුගේ සේවය ලබාගනිමින් ශ්‍රී ලංකා රබර් නිෂ්පාදකයින්ගේ හා අපනයනකරුවන්ගේ සංගමයේ (SLAMERP) හා ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනයේ (PRISL) සහයෝගීතාවය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දෙවන වරටද ටයර් සම්මිශ්‍රණය හා තාක්ෂණය පිලිබඳ එක් දින වැඩමුළුවක් කොළඹ දී සංවිධානය කරනු ලැබීය. කර්මාන්තයේ අගනා අභිවර්ධනයන් පිලිබඳ ඔවුන්ගේ දැනුම උත්ශ්‍රේණිගත කිරීම සඳහා මෙමගින් අවස්ථාවක් හිමිවූ බව සහභාගි වූවන්ගේ අදහස විය. නිෂ්පාදන නවෝත්පාදනය, තාක්ෂණ හා පර්යේෂණ හා සංවර්ධනය යන ක්ෂේත්‍රයන් ඇතුලත් මෙම වැඩමුළුව මගින් ටයර් කර්මාන්තයේ තාක්ෂණික අංශ පුද්ගලයින් සියයකට අධික සංඛ්‍යාවක් ප්‍රතිලාභ ලබා ගනු ලැබීය.

- **කුඩා රබර් වතු හිමියන් සඳහා ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩමුළුව (2019 දෙසැම්බර්)**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) හා රබර් පර්යේෂණ ආයතනයේ (RRI) සහයෝගිතාව ඇතිව **"නවින තාක්ෂණයන්ට අනුගතවීම හරහා කුඩා රබර් වතු හිමියන්ගේ ඵලදායිතාවය ඉහල නැංවීම"** පිළිබඳ දෙවන වැඩමුළුව 2019 දෙසැම්බර් 18 දින මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් කුඩා පරිමාණ රබර් වගාකරුවන් හතලිස් දෙනෙකු සඳහා පැවැත්විණ.

ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන කර්මාන්තය සඳහා තිරසාර සැපයුම් ජාලයක් සහතික කිරීමට අමතරව නිෂ්පාදන පිරිවැය අඩුකිරිම හා වගාවන්හි ලාභදායිතාවය වැඩිකිරිම සඳහා කුඩා රබර් වතු හිමියන් අතර ප්‍රත්‍යක්ෂ නවීන තාක්ෂණය භාවිතය ජනප්‍රිය කිරීම තුලින් ජාතික රබර් නිෂ්පාදනය හා සමස්ත ඵලදායිතාවය වැඩිකිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඉහත ආයතන වල සහයෝගිතාවය ඇතිව මේ සම්බන්ධ පළමු වැඩමුළුව තෝරාගත් කුඩා පරිමාණ රබර් වගාකරුවන් හතලිස් දෙනෙකු සඳහා 2019 මැයි 31 දින කැගල්ලේදී පවත්වනු ලැබීය.

සහභාගි වූවන් විසින් මෙවන් වැඩසටහනක් පළමු වරට අත්දකිනු ලැබූ බව පවසනු ලැබූ අතර ග්‍රාමීය ප්‍රදේශ වල තවත් වැඩසටහන් පවත්වන ලෙස ද ඉල්ලා සිටිනු ලැබීය. සහභාගිවූවන් සඳහා කිරි කැපීම ආරම්භය, අඩු තීව්‍ර රබර් කිරි කැපීම, අස්වැන්න වැඩිකිරීම, පාරිසරික ප්‍රතිලාභ පිළිබඳව හා ස්වභාවික රබර්මිල අඩු වැඩි වීම හා ඒ සඳහා වන ගෝලීය ඉල්ලුම පිළිබඳ සාමාන්‍ය දැනුම ලබාදෙනු ලැබීය.

තවද සහභාගිවූ රබර් වගාකරුවන් සඳහා දිරිගැන්වීමක් ලෙස ද්‍රව්‍යමය පැකේජයක් ලබාදෙනු ලැබිය. RDD හා RRI මගින් පිළිවෙලින් රබර් කිරි කපන පිහි හා රසායන ද්‍රව්‍ය ලබාදෙනු ලැබීය. ශ්‍රී ලංකාවේ ස්වභාවික රබර් යොදාගෙන රබර් නිෂ්පාදිත නිපදවන හා අපනයනය කරන ප්‍රමුඛ ආයතනයක් වන කැස්මෝ ලෝඩ්ස්ටාර් පුද්. සමාගම මගින් රබර් කිරි කැපීමේදී භාවිතාකරණ හෙඩ් ලයිට් ප්‍රදානය කරනු ලැබීය.

## 3. වෙළඳපල සංවර්ධනය හා ප්‍රවර්ධනය

### 3.1. විදේශීය වැඩසටහන්

**ජාත්‍යන්තර වෙළඳ ඉසව් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය**

සෑම වසරකම මෙන්ම, අපනයන සංවර්ධන මණ්ඩලය ලොව පුරා පැවැත්වෙන පිළිගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන හා ප්‍රදර්ශන සඳහා සහභාගි වීමට ශ්‍රී ලාංකීය සමාගම් සඳහා පහසුකම් සලසනු ලැබිය. මෙම සියළු වෙළඳ ප්‍රදර්ශනයන් හිදි අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන කුටිය සංවිධානය කරනු ලැබීය.

- **ආසියාව**

2019 නොවැම්බර් 5-10 දින දක්වා චීනයේ ෂැන්හයි නුවර පැවති China International Import Expo ප්‍රදර්ශනය සඳහා සමාගම් පහළොවක් (15) සහභාගි විය. එම සමාගම් වලට ප්‍රදර්ශන හා B2B සාකච්ඡා සඳහා ඉල්ලීම් පන්දහසක් මෙන්ම ඇ.ඩො.1,406,023ක් වටිනා තහවුරු වූ ඇණවුම් ද ලබාගත හැකිවිය.

තවද, 2019 මැයි 8 සිට 10 දක්වා ජපානයේ පැවති IT Week සඳහා ICT/BPM සමාගම් 9ක් සහභාගි විය. බද්ධ ව්‍යාපාර අවස්ථා හතරක් ඇතිකර ගැනීමට අමතරව ඇ.ඩො.මිලියනයක් වටිනා ගිවිසුම් සඳහා එළඹීමට එම සමාගම් වලට හැකිවිය. මණ්ඩලය විසින් 2019 ජුනි 6 සිට 10 දින දක්වා පැවති Japan-Tokyo International Mineral Fair සඳහා සහභාගි වීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්

අටදෙනෙක් සඳහා පහසුකම් සලසනු ලැබීය. ඔවුන්ට වටිනා හා අර්ධ වටිනා ගල් අලෙවිය මඟින් ඇ.ඩො. 227,000ක් උපයා ගැනීම හැකිවිය. පන්දහසක් පමණ ඔවුන්ගේ ප්‍රදර්ශන කුටිය නැරඹීම සඳහා පැමිණි අතර එහිදි ශ්‍රී ලංකාවේ මැණික් කැපීමේ කර්මාන්තයේ හැකියාවන් පිළිබඳ දැනුම ලබාදෙනු ලැබීය. තවද මණ්ඩලය විසින් 2019 සැප්තැම්බර් 10 සිට 14 දින දක්වා බැංකොක් නුවර පැවති මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හයදෙනෙකු සහභාගි කරවීමට කටයුතු කරනු ලැබීය. අපනයනකරුවන්ට ඇ.ඩො.150,000 වටිනා ඇණවුම් ලැබුණු අතර ඇමරිකා එක්සත් ජනපදය, තායිලන්තය, කැනඩාව, ප්‍රංශය හා චීනය යන රටවල ගැනුම්කරුවන් ගෙන් විමසුම්ද ලැබිණ. මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 13-25 දක්වා පැවති India International Mega Trade Fair සඳහා සහභාගි වීමට සමාගම් අටකට පහසුකම් සලසනු ලැබීය. ඒ සඳහා සහභාගි වූ සමාගම් වලට ආසන්න වශයෙන් ඇ.ඩො.100,000 තහවුරු වූ ඇණවුම් ලැබුණු අතර ඇ.ඩො.37,000ක් වටිනා ඇණවුම් සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකෙරෙමින් පවතී. එසේම 2020 පෙබරවාරි 20දින වන විට ඇ.ඩො.4500ක වටිනාකමකින් යුත් ඇණවුම් ක්‍රියාත්මක කිරීමට එම සමාගම් වලට හැකිවිය.

- **යුරෝපය**

2019 ඔක්තෝබර් 5 සිට 9 දින දක්වා ජර්මනියේ Cologne හි පැවති Anuga 2019 ප්‍රදර්ශනයට සහභාගි වීම සඳහා මණ්ඩලය විසින් සමාගම් දහනවයකට (19) සහය දෙනු ලැබීය.ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සඳහා වැඩි පිරිසක් ආකර්ශණය කර ගැනිම හා ශ්‍රී ලාංකීය සුපවේදයේ ආවේණික රසය හා ගුණය ප්‍රචලිත කිරීම සඳහා ඉවුම් පිහුම් සංදර්ශනයක් ද පැවැත්විණ. මෙහිදි අපනයනකරුවන්ට ඇ.ඩො.575,000ක් වටිනා තහවුරු වූ ඇණවුම් හා 1200 කට වැඩි ව්‍යාපාරික විමසුම් ලැබුණි. මණ්ඩලය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තුන්දෙනෙකු හා විශාල සමාගම් තුනක් සඳහා රබර් නිෂ්පාදන සම්බන්ධ B2B සාකච්ඡාවක් පවත්වනු ලැබීය. වැඩසටහන අතරතුර සමාගම් දෙකකට ඇ.ඩො.20,800ක් වටිනා ඇණවුම් ලැබුණු අතර ව්‍යායාම පටි, උණුවතුර බෝතල් හා දොර නැවතුම් (door stoppers) සඳහා ගිවිසුම් හයකට එළඹෙනු ලැබීය. සහභාගිවූ වන්ට වෙළඳපල ප්‍රවණතා හා නවෝත්පාදන නිෂ්පාදන, පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණය පිළිබඳ දැනුම ලබාගැනීමට හැකිවිය.

2019 මැයි 7 සිට 9 දින දක්වා බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර පැවති Belgium Seafood Global සඳහා සහභාගි වීමට මණ්ඩලය විසින් අපනයනකරුවන් සය දෙනෙකුට සහය දෙනු ලැබීය. මෙහිදි ඔවුන්ට ඇ.ඩො.මිලියන 0.36 ඇණවුම් ලැබුණු අතර මිලියන 1.9ක ඇණවුම් ක්‍රියාත්මක කරනු ලැබීය. 2019 අප්‍රේල් 23 සිට 26 දින දක්වා පැවති B2B සාකච්ඡාවෙන් අනතුරුව මණ්ඩලය විසින් සමාගම් හතක් ව්‍යාපාරික සංසදයක් සඳහා සහභාගි කරවනු ලැබීය. ආරම්භක ක්‍රියාකාරකම් වල කොටසක් ලෙස හංගේරියානු සමාගම් සමග B2B සාකච්ඡා තිහක් හා පෝලන්ත සමාගම් සඳහා B2B සාකච්ඡා පනහක් පවත්වනු ලැබීය.

- **මැද පෙරදිග**

2019 පෙබරවාරි 17 සිට 21 දින දක්වා පැවති ඩුබායි GULFFOOD ප්‍රදර්ශනය සඳහා සමාගම් විසිහයක් සහභාගි විය. මෙම සමාගම් විසින් ඇ.ඩො.7.86ක් වටිනා ඇණවුම් ක්‍රියාක්මක කරනු ලැබූ අතර ඇ.ඩො.8.42ක් වටිනා තහවුරු වූ ඇණවුම් ලැබුණි.

- **ඇමෙරිකා කලාපය**

මණ්ඩලය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සයදෙනෙකු හා මහා පරිමාණ සමාගම් තුනක් 2019 ජූලි 22 සිට 24 දක්වා පැවති USA Apparel Sourcing වැඩසටහන සඳහා සහභාගී කරවීමට කටයුතු කරනු ලැබීය. මෙහිදී සමාගම් තුනක් විසින් උනන්දුවක් දක්වන ලද ගැණුම්කරුවන් සඳහා සාම්පල, පිරිවැයකරණය හා මිලකරණය ඉදිරිපත් කරනු ලැබූ අතර ඇ.ඩො.100,000 වටිනා ඇණවුම් ලබාගත හැකිවිය. එසේම Canada – GIC Grocery Innovation සඳහා සහභාගි වූ සමාගම් නවයකට විභව්‍ය වෙළඳ විමසුම් සියයක් පමණ ලැබී ඇත. මෙම විමසුම්වලට අනතුරුව සමාගම් දෙකක් කැනඩාවට පොල්මද නිෂ්පාදන සාම්පල යවනු ලැබීය.

2019 පෙබරවාරි මාසයේ දී බ්‍රසීලයේ සාඕ පෝලෝ හි පැවති ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ ඉසව්වට සමගාමීව තේ, යන්ත්‍ර සූත්‍ර හා රබර් යන අංශ නියෝජනය කරමින් සමාගම් තුනක් ඇතුලත් ශ්‍රී ලාංකීය දූත පිරිසක් බ්‍රසීලයේ සංචාරය කරනු ලැබීය. මේ හරහා තේ සම්බන්ධ සමාගමට ඇ.එ.ජ. සමග සම්බන්ධතා ඇතිකර ගැනීමට හැකිවිය.

2019 ජුනි 25-29 දක්වා කාලයේ දී ආනයන නියෝජිතායතන සමග වටමේස සාකච්ඡා සඳහා සමාගම් තුනකින් සමන්විත ශ්‍රී ලාංකීය දූත කණ්ඩායමක් කියුබාවට සංචාරය කරනු ලැබීය. ඔවුන් පිරිසැකසුම් කරන ලද ආහාර, කුළුබඩු හා ශීතාගාර/අධිශීතකරණ සඳහා ඇති අවස්ථා හඳුනාගනු ලැබීය.

### 3.2. දේශිය වැඩසටහන්

අපනයනකරුවන් ට ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන හා B2B සාකච්ජා සඳහා සහභාගි වීම සඳහා පහසුකම් සැලසීමට අමතරව පෙර සේම අපනයනකරුවන් ට ඔවුන්ගේ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා සහය වීමට මණ්ඩලය විසින් දේශිය වෙළඳ ප්‍රදර්ශන වල ප්‍රදර්ශන කුටි සංවිධානය කිරීම හා සම සංවිධානය කිරීමේ කටයුතුවල යෙදුණි. .

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පාවහන් හා සම්භාණ්ඩ කර්මාන්තයේ පැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සුපුරුදු පරිදි මණ්ඩලය විසින් 2019 ජනවාරි 25 සිට 27 දක්වා 2019 පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්නය සම සංවිධානය කරනු ලැබිය. මෙමගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට/ ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන්ට වෙළඳපල අවස්ථා උදාවිය. වෙළඳ කුටි දෙසිය විසිපහකින් සමන්විත ප්‍රදර්ශනය සඳහා දේශිය ප්‍රදර්ශකයින්

එකසිය එක්දෙනෙක් හා විදේශීය ප්‍රදර්ශකයින් විසිහත් දෙනෙක් සහභාගි විය. නව අපනයනකරුවන් දෙදහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන සමඟ ලියාපදිංචි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දොළොස් දෙනෙක් සඳහා ප්‍රදර්ශන කුටි හයක් වෙන්කිරීමට කටයුතු කරනු ලැබීය. මෙම වාර්ෂික ඉසව්ව ආවරණය කිරීම සඳහා Mondapelle සඟරාවට අනුබද්ධ විදේශීය වාර්තාකරුවකු කැඳවීම සඳහා මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබිය.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් දසදෙනෙකුට Facets Sri Lanka ප්‍රදර්ශනයට සහභාගිවී ම සඳහා සහය විය. ඔවුන්ට විශේෂඥයින්ගේ මගපෙන්වීම යටතේ නිෂ්පාදනය කරන ලද හා සන්නාමනය කරන ලද ස්වර්ණාභරණ ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාව හිමිවිය. සහභාගි වූවන්ට එම ස්ථානයේදී රු.මිලි.3.5ක අලෙවියක් සිදුකරගත හැකිවිය.

## 4. සන්නාමකරණය හා නිෂ්පාදන ස්ථානගත කිරීම.

### 4.1. ලංකාවේ කුළුබඩු සන්නාමය (Ceylon Spices) දියත් කෙරේ.

ලංකාවේ කුළුබඩු සඳහා ජාතික සන්නාමයක් නිර්මාණය කරනු ලැබීය. (සන්නාම සළකුණ: සිංහයා, සන්නාම නාමය: ‘Ceylon Spices, සන්නාම වගන්තිය: “Born in Sri Lanka”)

වෙළඳ ලකුණු හයක් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ලියාපදංචි කරනු ලැබීය. (Ceylon spices, Ceylon Cinnamon, Ceylon Cardamom, Ceylon Nutmeg, Ceylon Mace සහ Ceylon Pepper)

ජාතික සන්නාමය 2019 සැප්තැම්බර් 25 දින කොළඹදී දියත්කරනු ලැබූ අතර ජාත්‍යන්තර සන්නාමය 2019 ඔක්තෝබර් 06 දින ජර්මනියේ ANUGA food fair හිදී දියත් කරනු ලැබිය.

සන්නාමය මගින් ශ්‍රී ලාංකීය කුළුබඩු වල ආවේණික ලක්ෂණ උපුටා දක්වන අතර ඒවා ලෝකයේ වෙනත් කුළුබඩු නිපදවන රටවල නිෂ්පාදන වලින් වෙන්කර දක්වනු ඇත. සන්නාමය මගින් ගැනුම්කරුවන් සඳහා සන්නාමයේ පාලන රෙගුලාසි සමග සම්බන්ධ තත්ව ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන සහතික කෙරේ.

### 4.2. ලංකාවේ කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය

ශ්‍රී ලංකාවේ කුරුඳු, මෙරට ප්‍රථම භූගෝලීය දර්ශකයක් (GI) සහිත නිෂ්පාදනය ලෙස ලියාපදිංචි කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමග කටයුතු කරනු ලැබීය.

- ලංකා කුරුඳු භූගෝලීය දර්ශක සංගමය (CCGIA) ස්ථාපනය කිරීම - අගයදාමයේ සියළු පාර්ශවකරුවන් ඇතුළුව සාමාජිකයින් දෙසිය දෙනෙකු මීට ඇතුලත්ය.
- භූගෝලීය දර්ශක වැඩමුළු – ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය ලබාගැනීමේ වාසි හා භූගෝලීය දර්ශක නිෂ්පාදනයන් ලෙස කුරුඳු අපනයනය කිරීමේ දී අනුගමනය කළයුතු පිරිවිතර පිළිබඳව කුරුඳු වගාකරන ප්‍රධාන දිස්ත්‍රික්කයන් හි පාර්ශවකරුවන් දැනුවත් කරන ලදී (වැව්ලිකරුවන්ගේ සංගමය සඳහා මාතර, ගාල්ල, රත්නපුරය, කළුතර, හම්බන්තොට හා කොළඹ වැඩමුළු හයක් පවත්වනු ලැබීය)
- භූගෝලීය දර්ශක නීතිය නෙටුම්පත් කිරීම සඳහා UNIDO හරහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) වෙත නෛතික උපදෙස් ලබාදෙනු ලැබීය.
- ලංකා කුරුඳු භූගෝලීය දර්ශක සංගමය සඳහා අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ඇතිකිරීමේ මූලික කටයුතු සිදුකරනු ලැබීය.

### 4.3. ඩුබායි EXPO 2020

අරාබි ලෝකයේ මෙතෙක් පැවැත්වෙන අභිමානවත්ම වෙළඳ ප්‍රදර්ශනය වන ඩුබායි EXPO 2020, 2020 වසරේ ඔක්තෝබර් 20 සිට 2021 අප්‍රේල් 10 අතර කාලයේදි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායිහි දි පැවැත්වේ. ඩුබායි හා අබුඩාබි අතර මැද පිහිටි හෙක්ටයාර 438ක භූමි ප්‍රදේශයක පැවැත්වෙන ලෝකයේ විවිධත්වයෙන් වැඩිම ප්‍රදර්ශනය ලෙස සැලකෙන මෙහිදී රටවල් 200කට වැඩි සංඛ්‍යාවක උසස්ම නිෂ්පාදන ප්‍රදර්ශනය කෙරෙන අතර ඒ සඳහා විදේශිකයින් 70%කින් සමන්විත මිලියන 25කට අධික පිරිසක් ආකර්ශණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඩුබායි EXPO 2020 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සමගින් මණ්ඩලය පෙරමුණ ගෙන සිටී. "Opportunity" යන තේමාව යටතේ ශ්‍රී ලංකාව සහභාගිවනු ඇති අතර "Island of Ingenuity" යන්න මෙරට ප්‍රදර්ශන කුටියේ මාතෘකාව ලෙස තෝරාගෙන ඇත. මේ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට පහසුකම් සැලසීම පිණිස 2019 දී ඩුබායි EXPO 2020 ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සඳහා නිල වෙබ් අඩවියක් ස්ථාපනය කරනු ලැබීය. මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තුවිද්‍යා පීඨයේ ඒකාබද්ධ නිර්මාණ දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයින් විසින් ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය නිර්මාණය කරනු ඇත. එමගින් අප රට විවිධ අපනයන පිරිනැමීම් වලින් අනූන බව විදහා දක්වන අතර ජාතික අපනයන උපායමාර්ග මගින් හඳුනාගත් ඉලක්කගත ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛතාව ලබාදෙමින් නවෝත්පාදන හා සේවාවන් හරහා ක්‍රියාත්මක අපනයන මධ්‍යස්ථානයක් ලෙස ද ප්‍රවර්ධනය කරනු ඇත.

### 4.4. ජනාධිපති අපනයන සම්මාන 2018/19

- අතිගරු ජනාධිපතිතුමාගේ අනුග්‍රහය යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද විසි තුන් වන ජනාධිපති සම්මාන උළෙල අපනයනකරුවන්, රාජ්‍ය නිලධාරීන් හා විශේෂ ආරාධිත අමුත්තන් ගණනාවකගේ සහභාගිත්වය ඇතිව 2019 සැප්තැම්බර් 19 වන බ්‍රහස්පතින්දා දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණ.

- මණ්ඩලය විසින් 1981 වසරේ දී ආරම්භ කරනු ලැබූ ජනාධිපති අපනයන සම්මාන ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා වන ගෞරවාන්විතම සම්මානය වන අතර අදාළ වර්ෂය තුල ශ්‍රී ලංකාවේ අපනයනයන් සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබාදෙනු ලැබූ අපනයනකරුවන් සඳහා සම්මාන පිරිනැමේ.

- 2018/19 පැවති විසි තුන්වන 2018/19 ජනාධිපති අපනයන සම්මාන උළෙලේ දී සමස්ත සම්මාන 14ක්, අංශ වශයෙන් සම්මාන 42ක් හා කුසලතා සහතිකපත් 33ක් පිරිනමනු ලැබීය. තවද, නව අපනයනකරවන් 2000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රන්, රිදී හා ලෝකඩ සම්මාන ලෙස විශේෂ අපනයන සංවර්ධන මණ්ඩල සම්මාන 3ක්ද එම උළෙලේදීම ප්‍රදානය කරනු ලැබීය.

## 5. නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන

කලාපීය වශයෙන් සිටින ව්‍යවසායකයින් අපනයන වෙළඳපලට පිවිසීම දිරිගැන්වීම හා අපනයන අගයදාමයන් හි දේශීය සැපයුම් ජාල සමග ඒකාබද්ධ කිරීමේ අරමුණ ඇතිව 2017-2020 වසර තුල නව අපනයනකරුවන් 2000ක් බිහිකිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය.

හඳුනාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවශ්‍යතා ඇගයීම මඟින් එක් එක් සමාගම්වල හඳුනාගත් අවශ්‍යතාවන් අනුව ධාරිතා සංවර්ධනය, නිෂ්පාදන වැඩිදියුණු කිරීම හා වෙළඳපල සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය විසින් සහය දෙනු ලැබීය. වසර තුලදී කලාපීය වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 2,095ක් සඳහා ප්‍රතිලාභ සලසමින් වැඩසටහන් එකසිය තිස් එකක් (131) පැවැත්විණ. මෙම වැඩසටහන මගින් මෙරටට ඇ.ඩො.මිලි.13.2ක මුළු අපනයන ආදායමක් ගෙනදෙමින් ඍජු අපනයනකරුවන් හැටදෙනෙක් හා වක්‍ර අපනයනකරුවන් හැත්තෑපස්දෙනෙක් බිහිකරනු ලැබීය

2019 ජනවාරි 28, පෙබරවාරි 22 හා මාර්තු 01 දින පිළිවෙලින් කෑගල්ල, අනුරාධපුර හා වවුනියා දිස්ත්‍රික්කවල "නව අපනයනකරුවන් 2000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන" පිළිබඳ ප්‍රධාන සමුළු තුනක් පවත්වනු ලැබීය. එක් එක් වැඩසටහන මගින් අපනයනකරුවන් හා වක්‍ර අපනයනකරුවන් ලෙස වැඩිදියුණු කලයුතු සමාගම් 25ක් හඳුනාගනු ලැබීය.

| සහය ලබාදීම | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| ධාරිතා සංවර්ධනය | 62 | 1,587 |
| නිෂ්පාදන වැඩිදියුණු කිරීම | 21 | 356 |
| වෙළඳපල සංවර්ධනය (දේශීය හා ජාත්‍යන්තර)<br>ජාත්‍යන්තර<br>• THAIFEX 2019, බැංකොක්<br>• Anna Poorna වෙළඳ ප්‍රදර්ශනය, ඉන්දියාව<br>• Manila Fame සඳහා නිරාවරණ සංචාරය, පිලිපීනය | 48 | 152 |
| **මුළු ගණන** | **131** | **2,095** |

<u>කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩසටහන</u>

කාන්තා ව්‍යවසායකයින් අපනයන ව්‍යාපාර සඳහා සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. මෙතෙක් මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා අපනයන විභව්‍ය කාන්තාවන් දෙසිය දෙනෙක්(200) හඳුනාගෙන ඇත. මෙම කාන්තා ව්‍යවසායකයින් ට දේශිය මෙන්ම ඔස්ට්‍රේලියානු කුසලාන (Australia Awards: Women Trading Globally –2019) වැනි ජාත්‍යන්තර ඉසව් ගණනාවක් සඳහා සහභාගි වීමට සහය හා මගපෙන්වීම ලබාදෙනු ලැබීය.

එයට අමතරව සමාලෝචනයට ලක්වන කාලසීමාව තුල සම්පත් බැංකුවේ සහය ඇතිව දින දෙකක ව්‍යාපාර සැලසුම් වැඩමුළුවක් පවත්වනු ලැබීය. මෙම වැඩමුළුවේදී ඊට සහභාගි වූ විසිදෙනෙකුට ව්‍යාපාර සැලසුම් සකස් කිරීම සඳහා සහයවනු ලැබීය.

# 6. වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු

## 6.1. අපනයනකරුවන්ගේ සංසද

අදාළ රජයේ ආයතන සමග සම්බන්ධ වීමට හා ඔවුන්ගේ වෙළඳ ගැටළු වලට ප්‍රතිචාර ලබාගැනීම සඳහා කර්මාන්තවල පැතිකඩක් නියෝජනය කරන අපනයනකරුවන්ට වේදිකාවක් සැපයීමේ අරමුණ ඇතිව විෂයභාර අමාත්‍යාංශයේ සහයෝගිතාවයෙන් මණ්ඩලය විසින් පසුගිය වසරේදී සංසද හතරක්(4) සංවිධානය කරනු ලැබීය. රටවල් අතර වෙළඳ පහසුකම් සැලසීම සඳහා අපනයනකරුවන්ට නියාමන, ප්‍රතිපත්තිමය හා මෙහෙයුම් ගැටළු සාකච්ඡා කිරීම හා විසඳීම සඳහා පොදු වේදිකාවක් සැපයීමට මෙම සංසදය පවත්වනු ලැබිය.

සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව 2019 ජනවාරි, අප්‍රේල්, ජුනි හා සැප්තැම්බර් මාස වලදී මෙම සංසද හතර පවත්වනු ලැබීය.

අපනයනකරුවන් විසින් තම ගැටළු තැපැල් මාර්ගයෙන්, විද්‍යුත් තැපැල (forum@edb.gov.lk) ඔස්සේ හෝ ඒ සඳහම වන සෘජු අන්තර්ජාල වේදිකාව - Online Alert for Trade Obstacles (OATO http://www.forum.edb.gov.lk/) හරහා ාපනයන සංවර්ධන මණ්ඩලය වෙත යොමු කෙරේ.

| විස්තරය | **17** වන **සංසදය** | **18** වන **සංසදය** | **19** වන **සංසදය** | **20** වන **සංසදය** |
|---|---|---|---|---|
| සාකච්ඡා සඳහා ගනු ලැබූ ගැටළු සංඛ්‍යාව | 19 | 11 | 11 | 10 |
| විසඳන ලද ගැටළු සංඛ්‍යාව | 09 | 04 | 08 | 06 |

### 6.2. අපනයන හා සම්බන්ධ ප්‍රකාශණ

### Business Lanka Magazine

ජාත්‍යන්තර වෙළඳපලෙහි ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අවස්ථාව සැලසීම සඳහා **"ව්‍යාපාරයන්හි නියලි කාන්තාවන්, ගෝලීය වෙළඳපලෙහි ශ්‍රී ලංකා සන්නාමනය හා සේවා සැපයීමේ අනාගත මධ්‍යස්ථානය" (The Future Hub for Logistics)** යන තේමාවන් ආවරණය කරමින් මණ්ඩලය විසින් කාර්තුමය ජාත්‍යන්තර සඟරාවේ වෙළුම් 03ක් පලකරනු ලැබූ අතර ඒවා ගමනාන්ත 500ක් වෙත යවනු ලැබීය. ගෝලීය වෙළඳපලෙහි ශ්‍රී ලංකා සන්නාමනය හා සේවා සැපයීමේ අනාගත මධ්‍යස්ථානය යන වෙළුම් වල ඉලෙක්ට්‍රොනික පිටපත් මණ්ඩලයේ වෙබ් අඩවියේ ද පළකරනු ලැබීය.

### Expo News

ජාත්‍යන්තර/දේශීය වෙළඳ ප්‍රදර්ශන/ඉසව්/හා මණ්ඩලයේ වෙළඳ දැන්වීම් පිළිබඳ වෙනත් වැදගත් තොරතුරු ඇතුලත් **Expo News** මාසික පුවත් ලිපියේ ඉලෙක්ට්‍රොනික පිටපත් 12ක් අපනයනකරුවන්/ ව්‍යවසායකයින් 1,165දෙනෙකු අතර බෙදාහරිනු ලැබීය.

### අපනයන කාර්යසාධක දර්ශක 2009-2018

ශ්‍රී ලංකාවේ අපනයන අංශයට අදාල විස්තීර්ණ දත්ත ඇතුලත් මෙම ප්‍රකාශණය මුද්‍රිත හා සංයුක්ත තැටි ආකාරයෙන් අදාල ආයතන, වෙළඳ මණ්ඩල, විශ්ව විද්‍යාල ආදිය අතර බෙදාහරිනු ලැබීය.

## 6.3. සහතිකපත් පාඨමාලා

- **ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් ආකාරය පිළිබඳ පාඨමාලාව Course on Operational Aspects of International Trade**

මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළඳාමේ නියැලි පෞද්ගලික හා රාජ්‍ය අංශ ආයතනයන් හි ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ තනතුරු දරන විධායක නිලධාරින් හතලිස් පස් දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව Operational Aspects of International Trade 87 වන පාඨමාලාව සාර්ථක ලෙස පවත්වනු ලැබීය.
සහභාගි වූවන් සඳහා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීම හා ඔවුන්ට එම ලබාගත් දැනුම එදිනෙදා මෙහෙයුම්වලදී යෙදවීමේ හැකියාව ලබාදීම මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ විය.

පාඨමාලාව අතරතුර සහභාගි වූවන්ට අපනයන ක්‍රියාවලිය හා සහතිකකරණය, නැව්ගත කිරීම හා ප්‍රවාහනය, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අපනයන ක්‍රියාවලිය හා ප්‍රලේඛණය, රේගු බැදුම්කර ක්‍රියාවලිය හා අපනයන සඳහා පහසුකම් සැලසීම, ගුවන් භාණ්ඩ ක්‍රියාවලිය, ඇසුරුම්කරණය, අලෙවි ගිවිසුම්, පිරිවැයකරණය හා මිලකරණය, ජාත්‍යන්තර වෙළඳාමේදී ගෙවීම් ක්‍රමවේදය, රේගු මිළ නියමකිරීම, ආයෝජන මණ්ඩල ක්‍රමවේදය, සමුද්‍ර රක්ෂණ හා නැව් බඩු රක්ෂණ, වරණීය වෙළඳ ගිවිසුම්, ජාත්‍යන්තර සාධකකරණය, විද්‍යුත් වෙළඳාම හා ගනුදෙනු කිරීම් පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාගත හැකිවිය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, බැංකු, අපනයන සංවර්ධන මණ්ඩලයේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හා වෙනත් අදාල වෘත්තීය ආයතනවල වෘත්තිකයන් විසින් දේශන පවත්වනු ලැබීය.

මීට අමතරව එක්දින අධ්‍යයන චාරිකාවක් තුල අපනයන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගුවේ අපනයන පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය, කටුනායක ගුවන් තොටුපලෙහි ගුවන් භාණ්ඩ ගම්මානයට සංචාරය කිරීමට ඔවුන්ට හැකිවිය.

- **ආනයන අපනයන ක්‍රියාවලිය පිළබඳ සහතිකකරණ පාඨමාලාව**

නැව් බඩු නිෂ්කාශන මෙහෙයුම්, ප්‍රවාහන හා නැව්ගත කිරීම පිළිබඳ සහභාගි වන්නන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මණ්ඩලය විසින් පිළිවෙලින් හතලිස් තුන් දෙනෙකු හා හතලිස් දෙනෙකු සඳහා 150 හා 151වෙනි පාඨමාලා පවත්වනු ලැබිය.

## 6.4. දැනුවත් කිරීමේ වැඩසටහන්

- අගෝස්තු මස 19 දින තොරතුරු තාක්ෂණ අපනයනකරුවන් අනුදෙනෙකු සඳහා ජපාන වෙළඳපල අවස්ථා පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්විණ.

- මුද්‍රණ සමාගම් හැත්තෑ දෙකක් සඳහා කුරුණෑගල හා මහනුවර පැවැත් වූ කලාපීය වැඩසටහන් දෙකේ දී වැඩිදියුණු කලයුතු සමාගම් විස්සක් හඳුනා ගැනිණි.
- ගමනාන්ත වරායන්හි දී ප්‍රතික්ෂේපවීම් අවම කිරීම සඳහා GCC ආහාර ප්‍රමිතීන් හා නියාමනයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා 120 දෙනෙකු සහභාගී විය.
- චීනය වෙත කාබනික කෘෂිකර්මික නිෂ්පාදන අපනයනයේ දී සපුරාලිය යුතු අවශ්‍යතා පිළිබඳව ඉගැන්වීමට අපනයනකරුවන් 101දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීය.
- ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණු සැසිය – විෂය/ධාරිතා ගොඩනැගීම පිළිබඳ සංවර්ධන නිලධාරින් 101 දෙනෙකු පුහුණු කරනු ලැබීය.
- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා රේගු හා අපනයන ක්‍රියාවලිය පිළිබඳ සැසිය - විශ්ව විද්‍යාල හා ආයතනය අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම.
- විභව්‍ය අපනයනකරුවන් සඳහා මාතර පැවති අපනයන ක්‍රියාවලිය පිළිබඳ සැසිය සඳහා 45 දෙනෙකු සහභාගී විය.
- අපනයන පහසුකම් සැළසීම සඳහා නව රේගු ආරම්භයන් - නව රේගු ආරම්භයන් පිළිබඳව අපනයනකරුවන් අසූදෙනෙකු දැනුවත් කරනු ලැබීය.
- ආයෝජන මණ්ඩලයේ කටුනායක අපනයන සැකසුම් කලාපයේ පැවැත්වූ මධ්‍යස්ථාන මෙහෙයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - මෙමගින් අපනයනකරුවන්/ සමාගම් හිමිකරුවන්/ කළමනාකරුවන් 44 දෙනෙකු ප්‍රතිලාභ ලැබීය.

## 6.5. විද්යුත් -වෙළඳපොළ (E-Marketplace)

වෙලඳපල ප්‍රවේශය වැඩිකිරීම, B2B හා B2C ගනුදෙනු හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ඊ-කොමර්ස් සඳහා පිවිසීමේ පහසුකම් සැලසීම අරමුණ කරගෙන මණ්ඩලය විසින් ජාතික අපනයන ඉලක්ක ලඟා කරගැනීම සඳහා ජාත්‍යන්තර වෙළඳපලෙහි ශ්‍රී ලාංකිය නිෂ්පාදන හා සේවාවන් අපනයනය සඳහා ජාතික පිවිසුමක් ලෙස එහි වෙබ් අඩවිය ප්‍රවර්ධනය කර ඇත.

සමාලෝචනයට ලක්වන කාලය තුල ඔස්ට්‍රියාව, බෙල්ජියම, ස්විට්සර්ලන්තය, ජපානය, හංගේරියාව, එක්සත් රාජධානිය, ස්විඩනය, කැනඩාව, සර්බියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා එක්සත් ජනපදය. සමග ඇ.ඩො.1679.55ක අන්තර්ජාල ගනු දෙනු සිදු කරනු ලැබීය.

අපනයන කරුවන් අසූදෙකකගේ තොරතුරු යාවත්කාලීන කිරීම හා නව අපනයන් කරුවන් පහළොවක් ඇතුලත් කිරීම මගින් අන්තර්ජාලගත ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ නාමාවලිය යාවත්කාලින කරනු ලැබීය. www.srilankabusiness.com වෙබ් අඩවිය හරහා ශ්‍රී ලංකිය නිෂ්පාදන, සේවාවන්, ශ්‍රී ලාංකීය සන්නාම ප්‍රවර්ධනය කිරීම.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ඩිජිටල්කරණය– www.srilankabusiness.com වෙබ් අඩවිය නැවත සකස් කිරීම.

- සමාජ මාධ්‍යජාලා හා බ්ලොග් පිටු හරහා ශ්‍රී ලංකිය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම- ෆේස් බුක්, ලින්ක්ඩ්ඉන්, ට්විටර්, යුටියුබ්, ප්‍රින්ටරෙස්ට්, ගුගල්+, තම්බ්ලර්.
- ජාත්‍යන්තර ප්‍රදර්ශන වලදී මණ්ඩලයේ ප්‍රදර්ශන කුටිය සඳහා අමුත්තන් ආකර්ශනය කරගැනීම සඳහා විශේෂ අන්තර්ජාල ප්‍රවර්ධන වැඩසටහන්.
- ශ්‍රී ලංකාවේ සිටින විදේශ දූත කණ්ඩායම්, වාණිජ මණ්ඩල, විදේශ රටවල විදේශ දූත කණ්ඩායම් හා වෙනත් වෘත්තීය ආයතන සමග වෙබ් සම්බන්ධතා ඇතිකර ගැනීම.
- මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා එයට සම්බන්ධව අඩු වියදමින් වෙබ් නිර්මාණ සේවා, වෙබ් හොස්ටින් සේවා, වෙබ් වෙළඳ දැන්වීම් සේවා මගින් අපනයනයන් හා සේවා සන්නාමයන් ප්‍රවර්ධනය සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම.
- වෙළඳපල ඥාණය හා අපනයන කාර්යසාධන වාර්තා හා සංඛ්‍යාලේඛණ ලබාදීම.
- අපනයනකරුවන්ගේ ප්‍රජාව, අධ්‍යාපනඥයින් හා පර්යේෂකයින් සඳහා සත්‍ය හා යාවත්කාලීන වෙළඳ තොරතුරු ලබාදීම.
- පිළිගත් අන්තර්ජාල ගැණුම්කරු දත්ත ගබඩා භාවිත කරමින් ගැණුම්කරුවන් පිළිබඳව එහි ඇති විස්තර සැපයීම.
- මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා අන්තර්ජාල වෙළඳ සංඛ්‍යා ලේඛණ, නිෂ්පාදන/ වෙළඳපල වාර්තා සැපයීම.

## 2020 වසර සඳහා අනාගත සැලසුම්

**<u>අපනයන සංවර්ධන හා ප්‍රවර්ධන වැඩසටහන්</u>**

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ගනු ලැබූ ආරම්භයන් රජයේ ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන ප්‍රතිපත්ති තුන වන - මිත්‍රශීලී හා නොබැදි ප්‍රතිපත්තිය, තාක්ෂණ පදනම් වූ සමාජය හා ජනතාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධනය සමඟ මූලික වශයෙන් ගලපනු ලැබ තිබේ. මිට අමතරව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා අගය එකතුකිරීම පිළිබඳව ද එමගින් අවධානය යොමුකර ඇත.

වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා 2020 දී ඇ.ඩො.බිලි.13.5ක අපනයන ඉලක්කයක් පිහිටුවා ඇති අතර එය 2019 ට සාපේක්ෂව 13.4%කින් වැඩිවීමකි. සේවා අපනයනය සඳහා වන ඇ.ඩො.බිලි.5ක අපනයන ඉලක්කය සඳහා 2019 වසරට වඩා 18.5% කින් වැඩිවීමකි.

**<u>උපායමාර්ගික අරමුණු</u>**

1) දැනට සිටින අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයනයන් වැඩිදියුණු කර ගැනීම සඳහා සහය වීම.
2) ශ්‍රී ලංකාවේ නව අපනයනකරුවන් ප්‍රවර්ධනය කිරීම
3) රටතුලට අපනයන පාදක විදේශ ආයෝජන ආකර්ශණය කිරීම
4) ශ්‍රී ලංකාවේ වත්මන් අපනයනය සංයුතිය වෙනස් කිරීම.
5) ධාරිතා ගොඩනැගීම වැඩිදියුණු කිරීම.

**1) දැනට සිටින අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයනයන් වැඩිදියුණු කර ගැනීම සඳහා සහයවීම**

- ශ්‍රී ලංකිය නිෂ්පාදන සඳහා ගෝලීය වෙළඳපළ ප්‍රවේශය වැඩිකිරීම.
- තෝරාගත් ප්‍රමුඛතාවන් හා නැගී එන වෙළඳපල සලකා වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම.
- තෝරාගත් වෙළඳපලවල් සඳහා රට තුලට හා රටින් පිටතට වෙළඳ දූත මෙහෙයන් සංවිධානය කිරීම.
- වෙළඳපල ඥාණය ලබාදීම.

**අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසිම**

- "අපනයන වෙළඳපල ප්‍රවේශ සහය" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- "තොරතුරු තාක්ෂණ ආරම්භයන්" වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- බෝට්ටු නිෂ්පාදනය සඳහා වන කාර්මික කලාපයක් ඇතිකිරීම.
- වෙළඳ වෙබ් පෝටලය ක්‍රියාකාරි කිරීම.

- චීන හා ඉන්දිය වෙළඳපල වලට ප්‍රවේශවීම සඳහා ශ්‍රී ලාංකීය සමාගම් වලට සහය වීම.
- ටයර් පරික්ෂා කිරීමේ හා වැඩිදියුණු කිරීමේ පර්යේෂණ පහසුකම් ඇතිකිරීම සඳහා පහසුකම් සැලසීම.
- ජාතික අපනයන උපායමාර්ගයන්හි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- වෙළඳ සංඛ්‍යාලේඛණ හා ගැනුම්කරුවන් පිළිබඳ තොරතුරු සැපයීම.
- අපනයනකරුවන් විසින් මුහුණ දී ඇති ගැටළු සඳහා පෞද්ගලිකව මෙන්ම අපනයනකරුවන්ගේ සංසද හරහා විසඳුම් ලබාදීම.
- ප්‍රවර්ධනය සඳහා අත්පත්‍රිකා නිර්මාණය කිරීම.
- Business Lanka Magazine, Directory of Exporters 2020 වැනි ප්‍රකාශන නිර්මාණය කිරීම.
- ආනයන/අපනයන ක්‍රියාවලිය හා ජාත්‍යන්තර වෙළඳාමේ දිශානතිය හා අපනයන ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ඊ-පුස්තකාලයක් ඇතිකිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලයේ 2020 ආයතනික වීඩියෝ පටය නිෂ්පාදනය කිරීම.
- ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානය මගින් අපනයනකරුවන්ට පිළිගැනීමක් ලබාදිම.
- ඊ-වෙළඳපළ - අන්තර්ජාල වාණිජ වේදිකාව ප්‍රවර්ධනය
- උපදේශක කමිටුවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.

**2) ශ්‍රී ලංකාවේ නව අපනයනකරුවන් බිහිවීම ප්‍රවර්ධනය කිරීම**

<u>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායනයින් සංවර්ධනය</u>

- **නව අපනයනකරුවන් 2000ක් සංවර්ධනය කිරීම**

- අපනයන ඉලක්ක කරගත් නව ව්‍යවසායන් හා අපනයන ඉලක්ක කරගත් නව කාන්තා ව්‍යවසායන් හඳුනාගැනීම.
- දැනුවත් භාවය ඇතිකිරීම සඳහා දිවයින පුරා ජාතික වැඩසටහන් පැවැත්වීම.
- නිෂ්පාදන සංවර්ධනය සඳහා කලාපිය වැඩසටහන් සංවිධානය කිරීම
- ඇසුරුම්කරණය, ලේබල්කරණය, අපනයන මිලකරණය හා පිරිවැයකරණය පිළිබඳ සමුළු පැවැත්වීම.

- **කාන්තා ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම**

- වෙළඳපල ප්‍රවේශ වැඩසටහනක් සංවිධානය කිරීම.
- ජාත්‍යන්තර හා දේශිය ප්‍රදර්ශන වලට සහභාගි වීම සඳහා කාන්තා ව්‍යවසායකයින්ට සහයවීම.
- ධාරිතා ගොඩනැගීමේ, නිෂ්පාදන හා වෙළඳපල සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.

- **එක් ගමක් - එක් නිෂ්පාදනයක් වැඩසටහන (OVOP)**

- කලාපීය මට්ටමින් පොකුරු ඇතිකර එම පොකුරු වල ගොවීන්ට අපනයනකරුවන් සමග සම්බන්ධ වීම සඳහා සහය වීම.

**3) රටතුලට අපනයන පාදක විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම**

- ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සමග ඒකාබද්ධව විභව්‍ය කොටස් සඳහා ආයෝජනය කලහැකි ආයෝජකයින් හඳුනාගැනීම හා ආරාධනා කිරීම.
- විදේශීය රටවල ශ්‍රී ලාංකීය දූත කණ්ඩායම්වල සහය ලබාගැනීම .

**4) ශ්‍රී ලංකාවේ වත්මන් අපනයනයන් වෙනස්කිරීම**

- ශ්‍රී ලංකිය නිෂ්පාදන ගෝලීයව සන්නාමනය සඳහා පහසුකම් සැලසීම
- ලංකා කුරුඳු සන්නාමය වැඩිදියුණුකිරීම හා ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්විම.
- ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI) ලබාගැනීම.
- "Expo Dubai 2020" සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම
- ජාතික කාබනික පාලන ඒකකය (NOCU) මෙහෙයුම්කරණය සඳහා පහසුකම් සැලසීම.
- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික අගයදාමයන්හි විශ්වාසනීයත්වය හා ප්‍රතිරූපය ආරක්ෂාකිරීම.
- වෙළඳ තොරතුරු, වෙළඳපල ඥාණය, විද්‍යුත් වෙළඳ සේවාවන් හා අපනයන හා සම්බන්ධ ප්‍රකාශන සැපයීම.
- මණ්ඩලයේ වෙබ් අඩවිය ඔස්සේ ශ්‍රී ලංකිය නිෂ්පාදන අන්තර්ජාලය හරහා ප්‍රවර්ධනය කිරීම.

**5) ධාරිතා ගොඩනැගීම වැඩිදියුණු කිරීම**

- අපනයනය හා සම්බන්ධ විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, කුසලතා සංවර්ධන වැඩසටහන් හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්විම.
- අපනයන සංවර්ධන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය.

# මූල්‍ය ප්‍රකාශන
# 2019

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 |
|---|---|---|---|
| **වත්කම්** | | රු. ශත. | රු. ශත. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ දේපල පිරියත හා උපකරණ | (8) | 34,490,100.29 | 52,536,442.45 |
| සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන | (9) | 1,052,821,878.95 | 997,488,451.76 |
| | | 1,087,311,979.24 | 1,050,024,894.21 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (10) | 54,800,083.23 | 56,069,284.38 |
| මුළු ජංගම නොවන වත්කම් | | 1,142,112,062.47 | 1,106,094,178.59 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (11) | 2,797,044.96 | 2,880,646.22 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (12) | 145,200,571.08 | 141,884,667.34 |
| අත්තිකාරම් හා ඉදිරි ගෙවීම් | (13) | 30,726,129.67 | 33,813,537.99 |
| මුදල් හා මුදල් සමාන දෑ | (14) | 13,010,416.74 | 27,562,559.10 |
| | | 191,734,162.45 | 206,141,410.65 |
| **මුළු වත්කම්** | | **1,333,846,224.92** | **1,312,235,589.24** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන හා වෙන් කිරීම්** | | | |
| ආධාර ලැබීම් - ප්‍රාග්ධන දායකත්වය | (15) | 10,014,284.00 | 10,014,284.00 |
| වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය | | 1,064,982,748.96 | 1,010,789,603.57 |
| මුළු හිමිකම් | | 1,074,997,032.96 | 1,020,803,887.57 |
| **ආධාර** | | | |
| ආධාර ලැබීම් - වෙනත් | (16) | 26,585,000.86 | 31,695,603.21 |
| | | 26,585,000.86 | 31,695,603.21 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන්කිරීම් හා අනිකුත් වගකීම් | (17) | 57,374,396.89 | 52,387,870.60 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (18) | 75,445,155.25 | 78,998,235.75 |
| | | 132,819,552.14 | 131,386,106.35 |
| **ජංගම වගකීම්** | | | |
| අනිකුත් ගෙවිය යුතු දෑ | (19) | 99,444,638.96 | 128,349,992.11 |
| | | 99,444,638.96 | 128,349,992.11 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,333,846,224.92** | **1,312,235,589.24** |

පිටු අංක 173 සිට 188 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 48 සිට 57 දක්වා ඇති සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන

| | | | |
|---|---|---|---|
| ප්‍රභාෂ් සුභසිංහ | ජේ. වික්‍රමසිංහ | ඩබ්.ජේ.ඩී.එස්. ගුණසිංහ | ජී. එම්. හේරත් |
| **සභාපති** | **අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික** | **අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික** | **මුදල් අධ්‍යක්ෂිකා** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ආදායම් හා වියදම් ප්‍රකාශය**

| | සටහන | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | (3) | 563,709,310.35 | 598,941,650.93 |
| අනෙකුත් ආදායම | (4) | 49,853,997.09 | 49,285,350.28 |
| මුළු ආදායම | | 613,563,307.44 | 648,227,001.21 |
| **වියදම** | | | |
| අපනයන සංවර්ධන වියදම් | (5) | (199,812,426.67) | (255,842,018.46) |
| පරිපාලන වියදම් | (6) | (400,254,354.14) | (399,629,455.25) |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | 13,496,526.63 | (7,244,472.50) |
| මූල්‍ය වියදම් | (7) | (2,084,743.82) | (985,362.28) |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදම් ඉක්මවූ ආදායම | | 11,411,782.81 | (8,229,834.78) |
| ආශ්‍රිත සමාගමේ ලාභ/ (අලාභ) කොටස | | 55,333,427.19 | (91,185,567.24) |
| ශුද්ධ ආදායම | | **66,745,210.00** | **(99,415,402.02)** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| දේපල හා පිරියත ප්‍රත්‍යාගණනයේ ලාභ/ (අලාභ) | | - | - |
| වර්ෂයේ අනිකුත් විස්තීර්ණ ආදායම | | - | - |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම** | | **66,745,210.00** | **(99,415,402.02)** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | රාජ්‍ය ආධාර | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|
| **2017.12.31 දිනට ශේෂය** | 10,014,284.00 | 1,093,329,063.03 | 1,103,343,347.03 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය | - | (99,415,402.02) | (99,415,402.02) |
| පෙර වර්ෂයේ ගැලපීම | - | 16,875,942.56 | 16,875,942.56 |
| **2018.12.31 දිනට ශේෂය** | **10,014,284.00** | **1,010,789,603.57** | **1,020,803,887.57** |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය | - | 66,745,210.00 | 66,745,210.00 |
| පෙර වර්ෂයේ ගැලපීම **(22)** | - | (12,552,064.61) | (12,552,064.61) |
| **2019.12.31 දිනට ශේෂය** | **10,014,284.00** | **1,064,982,748.96** | **1,074,997,032.96** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|
| | | රු. ශත. | රු. ශත. |
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම | | 66,745,210 | (99,415,402) |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් | | 11,534,578 | 13,781,736 |
| ආයෝජන වලින් ලද ආදායම | | (91,734,054) | 49,138,346 |
| පෙර වර්ශය සඳහා ගැලපුම් | | (4,541,281) | 16,875,943 |
| මූල්‍ය වියදම් | | 181,306 | 362,324 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ | | (6,143,679) | - |
| රාජ්‍ය ලැබීම සඳහා ක්‍රමක්ෂය | | (6,629,622) | (6,052,691) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 10,928,620 | 11,095,902 |
| හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදන | | (51,269) | 13,795,100 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | **(19,710,191)** | **(418,741)** |
| තොගය (වැඩිවීම)/ අඩුවීම | | 83,601 | (757,314) |
| ණයගැති හා ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම | | (1,995,434) | 3,555,350 |
| අත්තිකාරම් හා කලින් ගෙවීම් (වැඩිවීම)/ අඩුවීම | | 3,087,408 | (21,350,174) |
| වෙන්කිරීම් හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම) | | 4,986,526 | 32,959,814 |
| වෙනත් ගෙවියයුතු දෑ වැඩිවීම /(අඩුවීම) | | (28,905,353) | 29,106,068 |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | **(42,453,442)** | **43,095,003** |
| මූල්‍ය වියදම් ගෙවීම් | | (181,306) | (362,324) |
| පාරිතෝෂික ගෙවීම් | | (14,481,700) | (22,079,551) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(57,116,448)** | **20,653,128** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 8 | (1,649,991) | (4,665,508) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලැබීම් | | 6,163,679 | - |
| ලාභාංශ ලැබීම් | 4 | 34,827,622 | 40,197,528 |
| පොලී ලැබීම් | 4 | 1,573,005 | 1,849,692 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **40,914,314** | **37,381,712** |
| **මුදල් හා මුදල් සමාන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | |
| රාජ්‍ය ආධාර ලැබීම් | | 1,649,991 | 4,702,033 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **1,649,991** | **4,702,033** |
| වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම / (අඩුවීම) | | (14,552,143) | 62,736,874 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 27,562,559 | (35,174,315) |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **13,010,417** | **27,562,559** |
| **මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය** | | | |
| අතැති මුදල් | 15 | 26,671 | 62,047 |
| බැංකුවේ ඇති මුදල් | 15 | 12,983,746 | 27,500,512 |
| | | **13,010,417** | **27,562,559** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|---|---|
| (3) | **ආදායම්** | | | |
| | ලැබුනු භාණ්ඩාගාර අරමුදල් | | 466,850,008.33 | 529,907,492.28 |
| | සංවර්ධන කටයුතු සඳහා අපනයනකරුවන්ගේ දායකය | | 89,261,538.65 | 57,360,883.70 |
| | අන්තර්ජාල ආදායම් | | 328,426.75 | 379,070.00 |
| | විද්‍යුත් වෙළඳ ආදායම් | | 226,569.02 | 308,019.16 |
| | සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | | 5,799,461.99 | 5,752,100.00 |
| | පොත් අලෙවිය | | 312,160.00 | 233,362.00 |
| | වෙනත් ආදායම් | 3.1 | 931,145.61 | 5,000,723.79 |
| | | | **563,709,310.35** | **598,941,650.93** |

| | | | | |
|---|---|---|---|---|
| (3.1) | **වෙනත් ආදායම්** | | | |
| | පාවහන් සහ සම් නිෂ්පාදන ප්‍රදර්ශනය | | - | 110,000.00 |
| | වෙළඳපල සංවර්ධන සහකාර යෝජනා ක්‍රමය | | - | 854,000.00 |
| | සිලෝන් කුරුඳු ලාංඡනය ලියාපදිංචි කිරීම | | 160,500.00 | 165,000.00 |
| | පළාත් කාර්යාල වල වෙනත් ආදායම් | | 18,145.61 | 100,773.79 |
| | ආපසු නොගෙවන තැන්පතු | | 77,000.00 | 50,000.00 |
| | ණය පහසුකම් මත අයකල නීති ගාස්තු | | 25,500.00 | 11,000.00 |
| | දැන්වීම් පුවරු ආදායම - 9 වන මහල | | 650,000.00 | 700,000.00 |
| | ප්‍රතිපාදන සහ ගැලපීම් | | - | 3,009,950.00 |
| | | | **931,145.61** | **5,000,723.79** |

| | | | | |
|---|---|---|---|---|
| (4) | **අනෙකුත් ආදායම්** | | | |
| | සේවක ණය පොළී ආදායම් | | 5,225,047.68 | 6,522,847.81 |
| | අඩුකලා : ණයපොළී මත ගැලපීම | | (3,652,043.14) | (4,673,155.35) |
| | ශුද්ධ සේවක ණය පොළී ආදායම් | | 1,573,004.54 | 1,849,692.46 |
| | ලාභාංශ ආදායම | | 34,827,622.33 | 40,197,528.33 |
| | අනෙකුත් විවිධ ආදායම් | 4.1 | 6,823,748.10 | 1,185,438.81 |
| | රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | 6,629,622.12 | 6,052,690.68 |
| | | | **49,853,997.09** | **49,285,350.28** |

| | | | | |
|---|---|---|---|---|
| (4.1) | **අනෙකුත් විවිධ ආදායම්** | | | |
| | විවිධ ලැබීම් | | 363,889.73 | 231,134.23 |
| | එස්.එල් එක්ස්පෝ සඳහා අනුග්‍රාහකත්වය | | - | 750,000.00 |
| | ස්ථාවර වත්කම් විකිණීමේ ලාභ | | 6,143,678.90 | - |
| | ආදායම් - ලියාපදිංචිය / සේවා | | 298,500.00 | 158,075.75 |
| | විනිමය අනුපාතවල වෙනස | | 17,679.47 | 46,228.83 |
| | | | **6,823,748.10** | **1,185,438.81** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් | එස්.එල්.එෆ්.ආර්.එස් |
|---|---|---|---|
| | | 31.12.2019 | 31.12.2018 |
| | | රු. ශත. | රු. ශත. |
| (5) | **අපනයන සංවර්ධන වියදම්** | | |
| | නිෂ්පාදන/ වෙළඳපල සංවර්ධන වැඩසටහන් | 70,871,938.26 | 94,468,461.97 |
| | අපනයන වෙළඳ ප්‍රදර්ශන වැඩසටහන් - විදේශීය | 108,758,661.49 | 123,580,333.09 |
| | අපනයන වෙළඳ ප්‍රදර්ශන වැඩසටහන් - දේශීය | 74,925.23 | 13,372,985.11 |
| | WEDF | 755,100.00 | 712,093.37 |
| | ඒක්ස්පෝ ඩුබායි 2020 | 3,464,941.09 | - |
| | අපනයන වෙළඳ ප්‍රදර්ශන - දේශීය | 580,590.00 | 2,275,329.60 |
| | ප්‍රතිපත්ති හා සැළසුම් වියදම් | 2,508,297.00 | 8,101,669.79 |
| | ප්‍රාදේශීය සංවර්ධන වියදම් | 8,982,248.47 | 5,928,661.89 |
| | වෙළඳ තොරතුරු හා සේවා වියදම් | 3,815,725.13 | 7,194,915.37 |
| | ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිර්මාණය | - | 207,568.27 |
| | | **199,812,426.67** | **255,842,018.46** |
| (6) | **පරිපාලන වියදම්** | | |
| | වැටුප් හා වේතන | 146,294,818.00 | 142,808,241.17 |
| | අතිකාල හා නිවාඩු දීමනා | 13,961,198.97 | 9,318,771.02 |
| | ප්‍රසාද දීමනා | 2,592,000.00 | 3,093,155.50 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 20,157,414.00 | 19,368,961.45 |
| | සේවක භාරකාර අරමුදල | 4,031,638.56 | 3,909,643.88 |
| | පාරිතෝශික දීමනා ගෙවීම් | 10,928,619.75 | 11,095,902.25 |
| | සේවක සුභසාධනය | 13,288,873.63 | 13,535,976.41 |
| | වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම් | 10,433,627,65 | 11,089,554.79 |
| | බඳවා ගැනීමේ වියදම් | 663,272.19 | 1,866,125.48 |
| | විදුලි ගාස්තු | 22,763,533.10 | 16,952,769.10 |
| | ජල ගාස්තු | 886,939.89 | 919,457.28 |
| | නීති හා වෙනත් වෘත්තීය ගාස්තු | 354,246.00 | 323,179.76 |
| | ප්‍රචාරණ ගාස්තු | 680,046.77 | 414,996.20 |
| | ආරක්ෂක වියදම් | 4,002,006.63 | 4,466,242.85 |
| | විගණන ගාස්තු | 1,000,000.00 | 1614,600.00 |
| | මුද්‍රණ වියදම් | 497,157.50 | 636,757.34 |
| | ගමන් වියදම් | 18,091,841.34 | 18,024,092.60 |
| | විනෝදාශ්වාද | 202,389.34 | 145,216.70 |
| | පොදු වියදම් | 870,714.89 | 1,488,302.51 |
| | අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 890,782.00 | 1,270,819.00 |
| | කාර්යාල උපකරණ නඩත්තුව | 1,988,231.25 | 1,462,874.04 |
| | ගොඩනැගිලි කුලී | 76,637,031.59 | 72,520,044.13 |
| | ඉන්ධන හා තෙල් | 3,697,279.59 | 3,529,143.19 |
| | වාහන නඩත්තු අලුත්වැඩියා | 5,066,679.77 | 4,210,573.78 |
| | පුද්ගලික කුලී | 7,437,997.11 | 7,513,720.90 |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|
| **පරිපාලන වියදම්** | | |
| සන්නිවේදන හා සාමාජික මුදල් | 8,838,965.46 | 8,692,230.33 |
| ක්ෂයවීම් | 11,534,578.04 | 13,782,260.75 |
| දේශීය පුහුණු වියදම් | 1,977,714.38 | 1,382,327.19 |
| කාර්යාල අවශ්‍යතා | 4,946,428.55 | 4,756,280.85 |
| රක්ෂණ හා බලපත්‍ර අලුත් කිරීමේ වියදම් | 124,575.70 | - |
| විදේශීය පුහුණු වියදම් | 5,826,342.81 | 3,119,443.25 |
| ආයෝජන වටිනාකම හානිකරණ සඳහා ප්‍රතිපාදන | (475,108.70) | 16,258,550.00 |
| ISO ක්‍රියාත්මක කිරීමේ වියදම් | 62,818.38 | 59,241.55 |
| | **400,254,354.14** | **399,629,455.25** |

| | | |
|---|---|---|
| (7) **මූල්‍ය පිරිවැය** | | |
| පොළී වියදම් | 181,306.13 | 362,324.15 |
| මුද්දර ගාස්තු | 1,416,869.76 | 100,284.76 |
| මූල්‍ය වියදම් | 486,567.93 | 522,753.37 |
| | **2,084,743.82** | **985,362.28** |

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## 2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්

**(8) දේපල, යන්ත්‍ර හා උපකරණ**

**(8.1) පිරිවැය**

| ශේෂය 01/01/2018 | වත්කම් | ශේෂය 01/01/2019 | එකතුකිරීම් | නැවත තක්සේරු කිරීම් | ඉවත්කිරීම් | ශේෂය 31/12/2019 |
|---|---|---|---|---|---|---|
| 75,376,450.00 | මෝටර් රථ | 75,376,450.00 | - | - | 3,650,000.00 | 71,726,450.00 |
| 38,755,708.52 | පරිඝණක | 41,839,508.52 | 125,880.00 | - | - | 41,965,388.52 |
| 5,751,681.00 | පරිඝණක මෘදුකාංග | 5,734,481.00 | - | - | - | 5,734,481.00 |
| 1,362,942.85 | පරිඝණක උපකරණ | 1,760,910.57 | 201,545.50 | - | - | 1,962,456.07 |
| 735,930.00 | කියෝස්ක් පද්ධතිය | 735,930.00 | - | - | - | 735,930.00 |
| 4,816,845.01 | රූපවාහිනී උපකරණ | 4,816,845.01 | - | - | - | 4,816,845.01 |
| 65,549.00 | PABX උපකරණ | 65,549.00 | 77,625.00 | - | - | 143,174.00 |
| 1,632,002.14 | දුරකථන සවිකිරීම් | 1,720,102.14 | 49,452.50 | - | - | 1,769,554.64 |
| 15,844,307.07 | ලී බඩු සවිකිරීම් | 16,326,607.07 | 51,551.88 | - | - | 16,378,158.95 |
| 16,867,974.09 | කාර්යාල උපකරණ | 17,498,514.09 | 1,124,436.50 | - | - | 18,622,950.59 |
| 15,240.00 | වෙනත් උපකරණ | 15,240.00 | 19,500.00 | - | - | 34,740.00 |
| 116,442.00 | ගෘහස්ත දුරකතන | 116,442.00 | - | - | - | 116,442.00 |
| **161,341,071.68** | | **166,006,579.40** | **1,649,991.38** | - | **3,650,000.00** | **164,006,570.78** |

**(8.2) ක්ෂය වෙන්කිරීම්**

| ශේෂය 01.01.2018 | වත්කම් | ශේෂය 01/01/2019 | පෙර වර්ෂ සඳහා ගැලපුම් | වර්ෂය සඳහා ක්ෂය | ඉවත්කිරීම් සඳහා ක්ෂය | ශේෂය 31/12/2019 |
|---|---|---|---|---|---|---|
| 35,543,353.32 | මෝටර් රථ | 43,800,998.32 | 8,100,000.00 | 6,242,645.00 | 3,630,000.00 | 54,513,643.32 |
| 32,541,802.82 | පරිඝණක | 34,716,682.27 | | 2,302,541.70 | | 37,019,223.97 |
| 3,805,430.49 | පරිඝණක මෘදුකාංග | 4,684,870.99 | | 397,300.00 | | 5,082,170.99 |
| 884,623.84 | පරිඝණක උපකරණ | 1,114,873.81 | 28,973.87 | 220,529.27 | | 1,364,376.95 |
| 159,451.50 | කියෝස්ක් පද්ධතිය | 306,637.50 | | 147,186.00 | | 453,823.50 |
| 3,984,519.89 | රූපවාහිනී උපකරණ | 4,215,231.00 | | 230,711.11 | | 4,445,942.11 |
| 47,306.91 | PABX උපකරණ | 53,861.81 | | 11,729.90 | | 65,591.71 |
| 1,543,935.43 | දුරකථන සවිකිරීම් | 1,580,332.41 | 4,200.00 | 51,600.15 | | 1,636,132.56 |
| 8,050,759.73 | ලී බඩු සවිකිරීම් | 8,875,044.79 | | 849,555.59 | | 9,724,600.38 |
| 13,058,155.12 | කාර්යාල උපකරණ | 14,040,340.77 | 8,706.46 | 1,063,286.90 | | 15,112,334.13 |
| 305.00 | වෙනත් උපකරණ | 5,384.49 | | 10,495.62 | | 15,880.11 |
| 68,757.15 | ගෘහස්ත දුරකතන | 75,878.79 | (124.83) | 6,996.80 | | 82,750.76 |
| **99,688,401.20** | | **113,470,136.95** | **8,141,755.50** | **11,534,578.04** | **3,630,000.00** | **129,516,470.49** |

| | *ලියා හරින ලද වටිනාකම* | **2019** | **2018** |
|---|---|---|---|
| 161,341,071.68 | පිරිවැය | 164,006,570.78 | 166,006,579.40 |
| (**99,688,401.20**) | සමුච්චිත ක්ෂයවීම් | (129,516,470.49) | (113,470,136.95) |
| **61,652,670.48** | ලියා හරින ලද වටිනාකම | **34,490,100.29** | **52,536,442.45** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්

| | | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|---|---|
| **(9)** | **ආශ්‍රිත සමාගම් වල ආයෝජන - ලයිස්තුගත නොවන** | | | |
| | ආශ්‍රිත සමාගම් වල ආයෝජන - ඩී.එච්.පී.එල් | | 1,052,821,878.95 | 997,488,451.76 |
| | | | **1,052,821,878.95** | **997,488,451.76** |
| **(10)** | **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | | |
| | කොටස්වල ආයෝජන | **(10.1)** | 25,084,418.82 | 25,033,150.00 |
| | කාර්‍ය මණ්ඩල ණය - ජංගම නොවන | **(12.1)** | 29,715,664.41 | 31,036,134.38 |
| | | | **54,800,083.23** | **56,069,284.38** |
| **(10.1)** | **කොටස් වල ආයෝජන** | | | |
| | නිදහස් කළ හැකි වරණීය කොටස් | | 105,117,477.60 | 105,066,208.78 |
| | සාමාන්‍ය කොටස් | | 58,312,483.61 | 58,312,483.61 |
| | (-) හානිකරණ සඳහා වෙන්කිරීම් | | (138,345,542.39) | (138,345,542.39) |
| | | | **25,084,418.82** | **25,033,150.00** |
| **(11)** | **තොගය** | | | |
| | ලිපිද්‍රව්‍ය | | 2,797,044.96 | 2,502,172.55 |
| | ටයර් සහ ටියුබ් | | - | 378,473.67 |
| | | | **2,797,044.96** | **2,880,646.22** |
| **(12)** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| | අපනයනකරුවන්ගේ ණය | | 40,262,508.60 | 40,801,501.60 |
| | (-) ණයගැති හානිකරණ වෙන්කිරීම් | | (40,262,508.60) | (40,801,501.60) |
| | කාර්‍ය මණ්ඩල ණය - ජංගම | **(12.1)** | 14,531,774.33 | 11,424,223.21 |
| | ලැබිය යුතු එකතුකල අගය මත බදු | | 104,676,878.80 | 104,676,878.80 |
| | ඌව පරණගම අපනයන ගම්මාන - පාලන ගිණුම | | 10,403,683.00 | 10,403,683.00 |
| | වෙනත් ණයගැති | | 15,588,234.95 | 15,379,882.33 |
| | | | **145,200,571.08** | **141,884,667.34** |
| **(12.1)** | **කාර්ය මණ්ඩල ණය** | | | |
| | <u>ජංගම නොවන</u> | | | |
| | කාර්ය මණ්ඩල ණය | | 33,127,689.50 | 31,036,134.38 |
| | (-) ගෙවිය යුතු සේවක පිරිවැය | | (19,543,308.02) | (498,232.18) |
| | පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | | 16,131,282.93 | 498,232.18 |
| | | | **29,715,664.41** | **31,036,134.38** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|---|
| | **කාර්ය මණ්ඩල ණය** | | |
| | **ජංගම** | | |
| | කාර්ය මණ්ඩල ණය | 9,610,628.80 | 11,424,223.21 |
| | වෙළඳපල අනුපාත මත ගෙවිය යුතු පොළිය | 5,225,047.88 | - |
| | (-) නොගෙවූ ණය සඳහා වෙන්කිරීම් | (63,884.30) | - |
| | (-) ගෙවිය යුතු සේවක පිරිවැය | (1,374,769.13) | (1,107,632.05) |
| | පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 1,134,751.08 | 1,107,632.05 |
| | | **14,531,774.33** | **11,424,223.21** |
| **(13)** | **අත්තිකාරම් හා පෙර ගෙවුම්** | | |
| | පෙර ගෙවුම් | 26,128,827.21 | 24,449,872.17 |
| | අත්තිකාරම් | 2,975,042.46 | 6,522,015.66 |
| | බැංකු සුරක්ෂිත | 300,000.00 | 300,000.00 |
| | සේවා තැන්පතු | 1,322,260.00 | 1,572,260.00 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු | - | 969,390.16 |
| | | **30,726,129.67** | **33,813,537.99** |
| **(14)** | **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| | ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පතුව | 2,500.00 | 2,500.00 |
| | ලංකා බැංකුව - ලේක්වීව් ශාඛාව | 9,451,814.14 | 24,400,925.19 |
| | ජාතික සංවර්ධන බැංකුව | 2,626,497.33 | 2,746,062.27 |
| | ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව | 685,763.48 | 135,091.82 |
| | ඩී.එෆ්.සී.සී බැංකුව - කෝපරේට් ශාඛාව | 148,890.00 | 148,890.00 |
| | ලංකා බැංකුව - ඉල්ලුම් තැන්පතු | 10,000.00 | 10,000.00 |
| | සම්පත් බැංකුව - මහනුවර | 5,759.10 | 5,551.03 |
| | සම්පත් බැංකුව - ගාල්ල | 7,747.94 | 7,494.08 |
| | ලංකා බැංකුව - මන්නාරම | 27,195.30 | 26,639.01 |
| | සම්පත් බැංකුව - කුරුණෑගල | 17,578.47 | 17,358.71 |
| | අතැති මුදල් | 26,670.98 | 62,046.99 |
| | | **13,010,416.74** | **27,562,559.10** |
| **(15)** | **රාජ්‍ය ලැබීම් - ප්‍රාග්ධන දායකය** | | |
| | රජයේ දායකය | 7,904,002.00 | 7,904,002.00 |
| | යූ.එන්.ඩී.පී. දායකය | 2,110,282.00 | 2,110,282.00 |
| | | **10,014,284.00** | **10,014,284.00** |
| **(16)** | **රාජ්‍ය ලැබීම්** | | |
| | රජයේ දායකය - මෝටර් රථ | 38,826,450.00 | 38,826,450.00 |
| | රජයේ දායකය - වෙනත් | 16,086,634.30 | 14,436,642.63 |
| | අයි.ටී.සී දායකය | 12,716.35 | 12,716.35 |
| | අපනයන ප්‍රවර්ධන ලේඛම් කාර්යාලය | 202,677.32 | 202,677.32 |
| | රාජ්‍ය ලැබීම් - වෙළඳපල ප්‍රවේශ වැඩසටහන | 939,000.00 | 939,000.00 |
| | (-) රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | (29,482,477.11) | (22,721,883.09) |
| | | **26,585,000.86** | **31,695,603.21** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2019 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2018 රු. ශත. |
|---|---|---|---|
| **(17)** | **වෙනත් වගකීම් හා වෙන්කිරීම්** | | |
| | ණය ආධාර ක්‍රම දායකත්වය | - | 7,820,688.23 |
| | ඌව පරණගම ආශ්‍රිත ගම්මාන | 2,108,251.77 | 2,108,251.77 |
| | අපනයනකරුවන්ගේ දායකයත්වය | 46,033,761.00 | 34,480,276.00 |
| | ආපසු ගෙවිය යුතු තැන්පතු | 9,232,384.12 | 7,978,654.60 |
| | | **57,374,396.89** | **52,387,870.60** |
| **(18)** | **පාරිතෝශික සඳහා වෙන්කිරීම්** | | |
| | 01.01.2019 වන විට ශේෂය | 78,998,235.75 | 89,981,884.30 |
| | වර්ෂය තුලදී කල වෙන්කිරීම් | 10,928,619.75 | 11,095,902.25 |
| | වර්ෂය තුලදී කල ගෙවීම් | (14,481,700.25) | (22,079,550.80) |
| | 31.12.2019 වන විට ශේෂය | **75,445,155.25** | **78,998,235.75** |
| **(19)** | **වෙනත් ගෙවිය යුතු දෑ** | | |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 31,075.00 | 20,125.00 |
| | ගෙවිය යුතු උ.වි.ගෙ බදු | 42,461.00 | 95,829.00 |
| | ගෙවිය යුතු විවිධ වියදම් | 46,059.72 | 165,739.98 |
| | ගෙවිය යුතු සේ.අ.අ. වියදම් | 2,805,494.66 | 2,567,672.87 |
| | ගෙවිය යුතු සේ.භා.අ. වියදම් | 336,659.34 | 308,120.77 |
| | ගෙවිය යුතු සේවක අවසාන ගෙවීම් | 47,781.13 | 85,807.19 |
| | ගෙවිය යුතු රඳවාගැනීමේ බදු | 4,053,473.14 | 4,513,260.00 |
| | ගෙවිය යුතු වැටුප් | 166,536.31 | 93,845.80 |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | 3,680,200.00 | 1,994,672.00 |
| | නැවත ගෙවිය යුතු ආරක්ෂණ තැන්පතු | 2,500.00 | 2,500.00 |
| | නැවත ගෙවිය යුතු තැන්පතු - ටෙන්ඩර් | 287,000.00 | 243,000.00 |
| | ඉදිරිපත් නොකල චෙක්පත් | 119,036.74 | 586,047.34 |
| | වෙනත් උපචිත වියදම් | 78,877,848.66 | 104,336,647.41 |
| | පාලන ගිණුම - ජාතික අපනයන උපායමාර්ග | 996,081.85 | 1,372,984.67 |
| | පාලන ගිණුම - වෙළඳපල ප්‍රවේශ වැඩසටහන | 3,981,199.66 | - |
| | පාලන ගිණුම - තොරතුරු තාක්ෂණ ආරම්භයන් | 3,597,926.21 | 5,771,436.28 |
| | පාලන ගිණුම - යටිතල පහසුකම්/ බෝට්ටු තැනීම් | 373,305.54 | 6,192,303.80 |
| | | **99,444,638.96** | **128,349,992.11** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

**(20)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ සඳහා පරීක්ෂා කරන ලදී. ඒ අනුව 01.01.2011 දිනට හානිකරණ වෙන්කිරීම් නැවත ගැලපීම රු. 31,698,150.00 කි.

**(21) කාර්ය මණ්ඩල ණය**

**(21.1)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 9 ට අනුව පවත්නා වර්ෂයේ පොළී අනුපාත වලින් අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ණය මුදල් අගයන් සාධාරණ අගයට පොත්වල පෙන්වා ඇත. ගෙවිය යුතු විලම්භිත සේවක පිරිවැය හා පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ගැලපීමෙන් පසු අගය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ පෙන්වා ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ පෙන්වා ඇත්තේ පහත පරිදිය.

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | රු. | 42,674,434.00 |
| අඩුකලා: ගෙවිය යුතු විලම්භිත සේවක පිරිවැය | රු. | (20,918,077.15) |
| එකතුකලා: පෙරගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | රු. | 17,266,034.01 |
| එකතුකලා: පවත්නා වර්ෂයේ පොළී අනුපාතය අනුව අයකල යුතු පොළිය | රු. | 5,225,047.88 |
| | රු. | 44,247,438.74 |

**(21.2)** සාධාරණ අගය ගණනය කිරීමේ දී හඳුනාගත් පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ අගය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කමක් ලෙස සටහන් කර ඇත. එය ණය කාලසීමාව තුල දී වියදමක් ලෙස හඳුනාගනු ඇත. 2019 වර්ෂයට අදාළ ප්‍රමාණය පහත පරිදි ආදායම් ප්‍රකාශයට අය කර ඇත.

| | | |
|---|---|---|
| පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | රු. | 20,918,077.15 |
| ආදායම් ප්‍රකාශයට අය කිරීම - 2019 | රු. | (3,652,043.14) |
| වර්ෂ අවසාන ශේෂය | රු. | 17,266,034.01 |

**(21.3)** 2018 වර්ෂයේ සඳහන් වූ පහත වියදම් හා ආදායම්, ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 9 ට අනුව නැවත සකස්කර ඇත.

| | | පරිපාලන වියදම් | වෙනත් ආදායම් |
|---|---|---|---|
| 2018 මූල්‍ය ප්‍රකාශය | රු. | 404,302,610.60 | 53,958,505.63 |
| 2019 මූල්‍ය ප්‍රකාශය | රු. | 399,629,455.25 | 49,285,350.28 |
| ශුද්ධ වෙනස | රු. | 4,673,155.35 | (4,673,155.35) |

## (22) පෙර වර්ෂයේ ගැලපීම්

පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් හි හඳුනා ගැනීම් සහ මිනුම් සම්බන්ධව සිදු වී ඇති වැරදි නිවැරදි කිරීම් වලට අදාළ ගැලපීම් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සිදුකර ඇත. LKAS 8 හි අංක 50 දරණ වගන්තියට අනුව "අතීතයට බලපාන පරිදි භාවිතය සහ අතීතයට බලපාන පරිදි ප්‍රතිස්ථාපනය ප්‍රායෝගික නොවන බව යටතේ" මෙම ගැලපීම් මේ වර්ෂය තුල සිදුකර පහත පරිදි සටහනක් මඟින් පෙන්වා ඇත.

| පෙර වර්ෂයේ වැරදි වල ස්වභාවය | මූල්‍ය ප්‍රකාශන වල බලපාන අයිතමය | වටිනාකම (රු) |
|---|---|---|
| ලෙජර ගණුදෙනු දෝෂ නිවැරදි කිරීම | අදාළ වියදම් ගිණුම් | 381,759.44 |
| 2018 ට අදාළ 2019 දී ගෙවන ලද වියදම් | අදාළ වියදම් ගිණුම් | 7,489,143.33 |
| අධි හා ඌන ප්‍රතිපාදන ආපසු හැරවීම | අදාළ වියදම් ගිණුම් | 194,882.07 |
| 2018 වර්ෂයේ ක්ෂයවීම් හා රාජ්‍ය ආධාර ක්‍රමක්ෂය වල නිවැරදි කිරීම් | සමුච්චිත ක්ෂය ගිණුම හා රාජ්‍ය ලැබීම් ගිණුම | 8,010,783.60 |
| පූර්ව වර්ෂ වලට අදාළ ප්‍රතිපාදන සැපයීම | අදාළ වියදම් ගිණුම් | (140,932.13) |
| චෙක්පත් කල් ඉකුත්වීම හේතුවෙන් අවලංගු කිරීම | අදාළ ලෙජර ගිණුම් | (3,383,571.70) |
| | | 12,552,064.61 |

## (23) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු.

සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු ලෙස සළකනු ලබන්නේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වල දී ආශ්‍රිත සමාගම වන ඩිවෙලොප්මන්ට් හෝල්ඩින්ග්ස් සමාගම වෙත කරනු ලබන ගෙවීම් ය. වර්ෂය තුලදී සිදු කරනු ලැබූ ගෙවීම් සහ ගෙවිය යුතු අගයන් ඇතුලත් පහත තොරතුරු LKAS 24 (18 වන ඡේදය) අනාවරණය කිරීමේ අවශ්‍යතා අනුව ඉදිරිපත් කෙරේ.

| නම | ගනුදෙනුව | 2019 (රු.) | 2018 (රු.) |
|---|---|---|---|
| ඩිවෙලොප්න්ට් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | මාසික කුළිය | 73,010,000.00 | 39,312.500.00 |
| | වාහන ගාල් කිරීමේ ගාස්තු | 796,785.74 | 698,214.30 |
| | විදුලිබල වියදම් | 18,713,737.9 | 13,982,726.65 |
| | ජල වියදම් | 337,401.34 | 211,032.52 |
| | වායුසමීකරණ වියදම් | 121,239.92 | 125,414.57 |
| | සනීපාරක්ෂක වියදම් | 182,181.07 | 182,181.07 |
| | ශ්‍රවණාගාර ගාස්තු | 1,308,082.72 | 353,322.77 |
| | ලාභාංශ ලැබීම් | 34,634,083.40 | 36,244,971.00 |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
**2019.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන සටහන්**

**(24) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්**

පහත සඳහන් විස්තර හැර ශේෂ පත්‍ර දිනට වෙනත් අවිනිශ්චිත වත්කම් හෝ වගකීම් නොමැත.

| | 2019.12.31 දිනට පැවති අසම්භාව්‍ය වත්කම් හා වගකීම් වල ස්වභාවය | අසම්භාව්‍ය වත්කම හටගත් පාර්ශවය | ඇස්තමේන්තු ගත මුදල් ගලා ඒම | මුදල් ලැබීම් මැනීමට නොහැකි නම් |
|---|---|---|---|---|
| i. | නොගෙවන ලද කුළී, විදුලිය හා පවිත්‍රතා ගාස්තු අයකිරීමට නඩු පැවරීම - වෙන්නායි වෙළඳ මධ්‍යස්තානය. | පීමා හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | 634,151.00 | |
| | | ජෙම් නේශන් (පුද්ගලික) සමාගම | 2,226,546.78 | |
| | | යුනික් මල්ටි ආර්ටිස්ට් | 194,142.50 | නීති වියදම |
| | | සාරා ඔෆ් ලෙදර්ස් (පුද්ගලික) සමාගම | 1,131,017.00 | - |
| ii. | ණය පැහැරහැරීම් | වර්ක්ස් ඔෆ් ආර්ට් | 34,000.00 | - |
| | | රාජාස් ජුවෙලරි | 90,418.00 | - |
| | | සිලෝන් ඕනමෙන්ටල් සෙරමික්ස් | 299,720.00 | - |
| | | කොකොනට් හස්ක් චිප්ස් | 29,809.46 | - |
| | | සමන් ජෙම් ඇන්ඩ් ජුවෙලර්ස් | 252,912.02 | - |
| | | යුනිසයිකල් මාර්කටින් | 278,455.58 | - |
| | | වර්ල්ඩ් ෆැෂන් | 30,000.00 | - |
| | | යුනික් මල්ටි ආර්ටිස්ට් | 187,006.54 | - |
| iii. | බැඳුම්කරය ආපසු ගැනීම | සිරිකුමාර | 104,725.45 | - |
| iv. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවන ලද අත්තිකාරම් ගෙවීම් ආපසු ගෙවීමේ නඩුව. | සෝලාර් ග්‍රීන් ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම | 1,505,932.00 | - |
| V. | වැටුප් අයකර ගැනීම - සමත මණ්ඩලයේ මැදිහත්වීමෙන් අනතුරුව. | ගිහාන් චතුරංග | 12,582.24 | - |
| | | ඩබ්.එච්.සී.ඩබ්. ප්‍රනාන්දු | 49,783.93 | - |
| | | එන්.ඩබ්.ඩී. සිහිනුවන් | 50,677.50 | - |

## විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ටිසිඑම2/එජ/ඊඩීබී/1/19/13 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date 2020 ජුලි 17 දින

RECEIVED
21 JUL 2020
Chairman's Office

සභාපති

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

එකතු කල අගය මත බදු ගිණුමේ ලැබිය යුතු ශේෂය ලෙස රු.104,676,878 ක් 2012 වර්ෂයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අංක TIN 409015026-7000 යටතේ බදු ආදායමට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවා ඇති 2020 පෙබරවාරි 17 දිනැති ලිපිය ප්‍රකාරව මණ්ඩලයට ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැති බව දන්වා එවා තිබූ නමුත් මණ්ඩලය විසින් එම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තක්සේරුවාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 395 | 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.263,078 ක් වූ 2017 හා 2018 වර්ෂවලට අයත් හඳුනා නොගත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 396 | 2019 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් සඳහා නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ අගරු වූ රු.900,000 ක චෙක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන වර්ග අඩි 44990 වන DHPL ගොඩනැගිල්ල සඳහා වර්ග අඩියකට රු.1,500 බැගින් වාර්ෂික කුලිය වශයෙන් රු.මිලියන 67.48 ක් ගෙවීමට සිදුවීමත් භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත්

නොවීමෙන් වාර්ෂිකව ඇතිවන හිඟ ගොඩනැගිලි කුලිය අවම කර ගැනීමේ හා ඉඩකඩ උපරිමව භාවිතා කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහල් 5 ක පවත්වාගෙන යන කාර්යාලය මහල් 4 ක් දක්වා අඩුකර නැවත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2017 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත්, ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව තෝරාගත් ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය විසින් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රු. මිලියන 102.5ක මූල්‍ය හා තාක්ෂණික වාර්තා පිළියෙල කිරීම වෙනුවෙන් රු.175,950 ක ගාස්තුවක් අයකර තිබුණි. තවද ලංසු කැඳවීමේ ක්‍රියාවලියට ආරාධනා කිරීමේ පුවත්පත් දැන්වීම සඳහා රු.56,890 ක් ගෙවා තිබුණි.ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කර නොමැති බැවින් මෙම වියදම ආනර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය වේ.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

-------------------------------

(අ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

(i) ඌව පළාත් කෘෂි අපනයන කලාපයෙන් ලැබිය යුතු ශේෂයක් වන රු.10,403,683 ක් 2009 වර්ෂයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදීද ණය ලබා ගත් පුද්ගලයන් හඳුනාගෙන තිබූ නමුත් ලැබිය යුතු ශේෂයන් තහවුරු කර ගැනීමට හා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) වෙනත් ණයගැතියන් තුළ ඇතුළත් එකතුව රු.9,468,431 ක් වූ ණය ශේෂ 11 ක් මාස 06 ඉක්මවා ඇතත් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) 2019 දෙසැම්බර් 31 දිනට පවතින උපචිත වියදම් ශේෂය රු.78,877,848 ක් වූ අතර ඒ තුළ එකතුව රු.100,684 ක් වූ වෙනත් ගිණුම්වලට ගැලපිය යුතු ශේෂ ඇතුළත් වූ අතර රු.1,272,629 ක 2017 හා 2018 වර්ෂවලට අදාළව ගෙවිය යුතු වියදම්ද ඇතුළත්ව තිබුණි.

(ඇ) **කළමනාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතාව**

(i) 2019 දෙසැම්බර් 31 දින වනවිට වසා දමනු ලැබූ සහ අක්‍රිය තත්වයේ පවතින සමාගම් 29 ක වරණීය කොටස්වල සිදුකර තිබූ ආයෝජන වටිනාකම රු.105,117,477 කි. එම සමාගම් සොයා ගැනීමට නොහැකිවීමෙන් නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) 2019 දෙසැම්බර් 31 දිනට සමාගම් 33 ක සාමාන්‍ය කොටස්වල රු.58,312,483 ක් ආයෝජනය කර තිබූ අතර ඉන් සමාගම් 31 ක් ලාභ නොලබමින් හා අක්‍රියව පැවති අතර එම සමාගම්වල වත්කම් හා බැරකම් රාජසන්තක කර තිබේදැයි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් මණ්ඩලය විසින් විමසීම්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සමාගම් 2 කින් පමණක් ලාභාංශ ලෙස රු.193,538 ක් ලැබී තිබූ අතර ඒ අනුව මුළු ආයෝජනයට අනුව ප්‍රතිලාභ අනුපාතය සියයට 0.4 ක් වැනි ඉතා අඩු අගයක පැවතුණි.

(iii) ශ්‍රී ලංකා එක්ස්පෝ මැනේජ්මන්ට් පුද්ගලික සමාගම ස්වෙච්ඡාවෙන් ගනන් බේරා වසා දමා ඇති අතර සමාගම් ලියාපදිංචි නාම ලේඛනයේ 2010.01.22 දින සමාගමේ නම කපා ඉවත් කර සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 10 ක් ගත වුවද එහි සාමාන්‍ය කොටස්වල ආයෝජිත මුදල වන රු.1,980,130 ක් සඳහා හානිකරණ වෙන් කිරීම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබූ අතර එම අගය පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(iv) 1980, 1990 යන වර්ෂ වලදී ණය යෝජනා ක්‍රමයකින් අපනයනකරුවන්ට ලබා දුන් ණය මුදලෙන් 2019 දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු ණය ශේෂය රු.40,262,508 ක් වූ අතර වර්ෂය තුළ මණ්ඩලය විසින් අයකරගෙන තිබුණේ රු.538,993 ක් පමණි. එය වර්ෂය අරම්භයේ පැවති ණය ශේෂයෙන් සියයට 1.32 ක් වැනි ප්‍රතිශතයකි. මේ අනුව මණ්ඩලය විසින් අපනයන ණය අය කර ගැනීම දුර්වල තත්වයක පවතින බව නිරීක්ෂණය කෙරේ.

(v) දේශීය හා විදේශීය පුහුණු, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගි කරවීමේදී නිලධාරීන්ට අපක්ෂපාතීව නිසි අවස්ථාව ලබා නොදීමෙන් වසරක් තුළදී එකම නිලධාරියාට අවස්ථා කිහිපයක්ද, වසර කිහිපයක් ගතවූවද පුහුණු සඳහා අවස්ථාවන් නොලැබුණු නිලධාරීන්ද සිටීම නිසා පුහුණුවීම සඳහා ක්‍රමවේදයක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවද එවැනි ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(vi) ව්‍යවසායකයින් 2000 ක් නව අපනයනකරුවන් බවට පත්කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2017 සිට 2019 දක්වා රු.34,116,691 ක් වැයකර තිබුණි. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාලන කමිටුවක් පත්කල යුතු බව 2017 මාර්තු 30 දිනැති අංක 2017/03/20 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් දක්වා තිබුණද එසේ කර නොතිබුණි. තවද මෙම වැඩ සටහන් පැවැත්වීමට ස්ථාන තෝරා ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවා රු.3,473,425 ක් වැය කරමින් පෞද්ගලික හෝටල් 06ක වැඩසටහන් පවත්වා තිබුණි. මාතර පැවැත්වූ වැඩසටහන සඳහා ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු නොකිරීමෙන් ආහාර, නවාතැන් හා ප්‍රදර්ශන කුටි සඳහා රු.299,500 කද කුරුණෑගල පැවැත්වූ වැඩසටහනේදී ආහාර සඳහා රු.57,900 කද අනාර්ථික වියදම් දරා තිබුණි. මෙහිදී ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.215,900 ක් වැයකර තිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. මෙම වැඩ සටහනින් ව්‍යවසායකයින් 2000 ක් අපනයනයට යොමු කිරීමට අපේක්ෂා කලද, 2017- 2019 කාලය තුළ 155 දෙනෙකු පමණක් අපනයනයට යොමුවී තිබුණි.

(vii) 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 257 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 228 ක් වූයෙන් තනතුරු 29 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද කනිෂ්ඨ මට්ටමේ තනතුරු 9 ක්ද පහළ මට්ටමේ තනතුරු 8 ක්ද පුරප්පාඩුව පැවතිණි. මෙම පුරප්පාඩු අතර මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට සෘජුවම අදාළවන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) වැනි තනතුරුද පැවතිණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති